# <u>ගිහි වතේ සිට නිවන් දකින්න තිබෙන හරි මඟ කුමක්ද - දෙවන කොටස</u>
## <u>What is the ideal way to attain Nirvana leading a lay life - Part 02</u>

ඉතින් **දුක්ඛ, සංඛාර දුක්ඛ, විපරිණාම දුක්ඛ** කියන ඔන්න ඔය දුක් තුනක් ඔය ආකාරයෙන් ගොඩනැඟෙනවා.

So, the dukkha-dukkha, viparinama-dukkha and sankhara-dukkha, the three variants of dukkha arise this way.

ඉතින්, ලෝකයා ප්‍රිය ස්වභාවයයි – මධුර ස්වභාවයයි කියන යමක් තියෙනවා නම්, ඒක වටිනවා ද නැද්ද කියලා තීරණයක් එනවා ඔන්න ඔතනදී.

Thus, we get an answer to the question whether the worldly things that the worldly beings hold likable and sweet or delightful, are truly worthy or not.

මේ ප්‍රිය ස්වභාවය – මධුර ස්වභාවය කියන්නේ අපේ මායාවක් මිසක්, අපිට බැඳිලා – රැඳිලා ඉන්න හදාගෙන ගොඩනඟන්න පුලුවන් එකක් නෙමෙයි.

This likability and delightfulness is nothing but a mind made illusion, and not something that we can make up, maintain, rely on and hold on to.

(ශ්‍රාවක මහතෙක්): …. මැණිකක් කියලා හිතාගෙන තිරිවානා ගලක් තියන් හිටියා වාගේ!

A listener: It's like holding on to a quartz rock, thinking it's some gemstone.

(ස්වාමීන් වහන්සේ): අන්න, තියන් හිටියා වාගේ! ඔන්න ඕක දකිනවා. ඔන්න, අපිට දුකෙන් මිදෙන තැන දකින්නේ ඔතනින්.

Waharaka Thero: Exactly, we see this fact. This is where we'd know how to get rid of suffering.

දුකෙන් මිදෙන්න නම්, **දුකට හේතුව අපි දැකලා තියෙන්න ඕනේ, "වැඩක් නෑ" කියලා.**

To get rid of suffering, first we have to know its cause. Should see the cause of suffering as something worthless.

**දුක ට හේතුව කියන්නේ ප්‍රිය ස්වභාවය – මධුර ස්වභාවය. ඔන්න ඔය දුක ලෝකයා දකින්නේ නෑ** – බාහිර ලෝකයා. ඒක සැපයි කියලා දකින්නේ.

The cause of the suffering is the likability, the sweetness, that the worldly beings are after. They do not see the suffering hidden underneath, only see the surface pleasure that they bring.

එහෙනම්, ආර්යය ධර්මය තුළින් තමයි ප්‍රිය ස්වභාවයක් – මධුර ස්වභාවයක් ඇත්නම්, "හරයක් නෑ!" කියලා දකින්න ඕනේ, ඉස්සෙල්ලාම.

So from the Dhamma perspective, if there is some likability, some sweetness, we have to see them as futile.

දැන් ඒකේදී දකිනවා, ඒකේ යථා ධර්මතාවය දැක්කහාම, එහෙම එකක් "ප්‍රියයි – මධුරයි කියලා ගන්න වටිනවාද" කියලා, මානසිකත්වයට ගොඩනැඟිලා එනවා යථාර්තය.

When we see the actual facts of things, within our minds, we'll come to question if the worldly things actually deserve to be taken as likable or sweet.

"ඒක වටින්නේ නෑ නේ" කියලා එනවා.

We come to realise that they are totally worthless.

අන්න, **"යං දුක්ඛං – තදනත්ථා"**

This is the essence of the phrase "Yan dukkhan, thadanaththa"

– ඒක දෙන්නේ දුක නම්, අසහනය නම්, කවදාවත් අපි බලාපොරොත්තු වුනා සේ දෙන වස්තු නැත්නම් "මම – මගේ" කියන එක තුළ, අපිට ඕනේ විදිහට පවත්වන්න බෑ!

If it only gives suffering and there is nothing that lives up to the expectation, we can't keep the way we want, the things that we call me, myself and mine.

එහෙනම්, ඒක දැක්කාට පස්සේ අපිට එකක් වෙනවා, "එහෙනම්, කොහෙද ඒකේ හරයක්?"

Then, after seeing this we will come to know that, things have got no essence, nothing substantial, nothing fruitful to be had.

**"අසාරට්ඨේන අනත්ථා" – සාරත්වයක් නැති නිසා අනත්ථයි** කියලා කියන්නේ,

"Asarattena Anatta"- since there is no essence, we call it Anatta (Not worthy of owning).

නමුත් අද "අනාත්ම" කියනවා ඕකට. **"ආත්ම" කියන්නේ "ඇත!"** – හරවත් ය කියන එක.

But today this has been termed as "Anathma". "

"Athma" means existent. Having substantial qualities. Is of essence.

හර නෑ කියන **"අනාත්ම" කියන්නේ "නැත!"** නැත කියන එකට වෙන වචනයක් තියෙනවා ද?

"Anathma" means nonexistent. No essence. Is there any other word for nonexistent?

ආත්ම, ඒකේ අනික් පැත්ත අනාත්ම.

The opposite of Athma is Anathma.

**ඇත යනු එක අන්තයකි, නැත යනු එක අන්තයකි. මේ අන්ත දෙකට නොබැස මාධ්‍යය තුළින් තථාගතයන් වහන්සේ යථාවබෝධය ලැබුවා**.

Existent is one extreme, nonexistent is the other extreme. Without associating with neither of the extremes, the Lord Buddha became enlightened, associating the medium.

"අනාත්ම" නෙමෙයි "අනත්ථ" – අනත්ථ වචනේ! **අනත්ථ කියන්නේ? අසාරයි!**

"Anathma" is not the correct word, but "Anatta" is. Anatta means, of no essence.

**"අසාරට්ඨේන අනත්ථා!"** තෝරලාත් තියෙන්නේ ඔහොමයි.

The phrase "Asarattena Anatta" has been clarified this way.

අසාරයි කියන්නේ මොකද? හරයක් නෑ! අන්න, වටිනාකමක් නෑ කියලා දකින්න ඕනේ.

What do you mean by "Asara"? It means, of no essence, of no value, nothing substantial about it.

**ඇත ද නැත ද කියන දෙක අපිට අවශ්‍යය නෑ! ඒ අන්ත දෙක**, ඒක ඇති වුනත් එකයි, නැති වුනත් එකයි. ඔය වැඩපිළිවෙල හරයක් නෑ!

If it is existent, or nonexistent, we shouldn't really bother. These are the two extremes; of which we rather have nothing to do with. The physical and mental action process is of no essence.

උච්ඡේද එකට වැටෙනවා එතකොට.

If we are to take the meaning of "Anathma" for the word "Anatta", we fall on the "Annihilation-belief (uccheda-ditthi)", the belief in the non-existence of an ego-entity or personality, and which therefore, at the dissolution at death, will come to be annihilated.

ඉතින් "අනාත්මවාදය" කියලා එකක් අද අපිට කියනවා, බුදුරජාණන් වහන්සේ ගේ **මේ දහම අනාත්මවාදයි කියලා. ඒක වැරදි නේ,** කොහෙද තියෙන්නේ එහෙම කියලා?

Thus they point that Buddhism is for Annihilation-belief. Well that is wrong, where in Dhamma has such a thing been said?

ඒ එකක් වත් මෙතන නෑ – අනත්ථයි! යථාර්තවාදියි! යථාර්තය පෙන්වන්නේ. අන්න, යථාර්තය නම් මොකද්ද? ඕකේ හරයක් නෑ!

Anatta has nothing to do with "Annihilation-belief (uccheda-ditthi)" or Eternity-belief (sassata-ditthi)). It means, it is of no essence.

ලෝකයා හොඳයි කියලා ගන්න ඒවා තියෙනවා, ප්‍රිය ස්වභාව – මධුර ස්වභාව. හැබැයි හරයක් නෑ!

There are things that the inept worldly beings take as likable and delightful. However, they are of no essence.

**ඒක ඇත–නැත කියලා ගත්තොත් එහෙම, "නෑ කියන්නේ කොහොමද මේ පෙනි–පෙනී තියෙන්නේ?" කියලා මිනිස්සු අහනවා.**

If we fall on to the existent, nonexistent argument, if we say it's nonexistent, people would say "how can you deny the presence of something, that is obviously present".

**එතකොට, ඒක තියෙනවා කියලා ගත්තොත් "උඹලා ආත්ම දෘෂ්ඨියෙන් යුක්තයි" කියලා අනිත් සැරේ කියනවා.**

If we say it's nonexistent, then people would say, that you are on the side of the Eternity-belief (sassata-ditthi).

එහෙනම්, තර්ක-වාදයට ගෝචර වෙන ප්‍රශ්නයක් වෙනවා එහෙම ගන්න ගියොත්.

Then we'd get entangled in some totally unwarranted arguments.

ඕක **තිබුණා – නැතා කියන ප්‍රශ්නේ නෙමෙයි තියෙන්න ඕනේ, ඕකේ හරයක් නෑ!**

Be that existent or nonexistent, it is of no essence.

ඒකට මොකද කියන්නේ? ඒකට නම් කියන්න දෙයක් නෑ, පිලිගන්න වෙනවා කියන්න වෙනවා අන්තිමට, අහගෙන යනකොට.

Now how can anybody question this? Can't deny, has to accept.

ඔන්න ඔය වචනේ අපේ සිංහල – ඕක තමයි පද නිරුක්තියක් තියෙනවා. මේ පදයේ නිරුක්තිය හැඟවිලා තියෙන්නේ.

The word Anicca has a linguistic expression. We call this "Nirukthi". The linguistic expression is hidden, sort of encoded.

අර **"නිරුක්ති පටිසම්භිදා ඥාණං බුද්ධ ඥාණං"** කිවුවේ ඔන්න ඔය, ඕක **සිවු පිළිසිඹියා ඥාණයක්.**

Knowledge of discrimination of linguistic expression is a part of 73 types of knowledge of a Lord Buddha. A skill coming under the four discriminations.

ඔය අන්න ඒ වචනේ තියෙන පදයේ අර්ථය හැඟවෙච්චි එකයි මේ ප්‍රශ්නය තියෙන්නේ.

The cover-up of the lignuistic expression of the word Anicca is the problem.

**අන්න, න + ඉච්ඡ – අන් + ඉච්ච – අනිච්ච – ඉච්ච සේ නෑ** කියන එකයි මේ වචනෙන් හැඟවිලා තියෙන අර්ථයේ තියෙනවා.

The hidden meaning is not to one's liking (Iccha is liking, Anicca is not to one's liking)

අනත්ථ – අනර්ථ කියනවා සංස්කෘතෙන්, අනත්ථ කියනවා පාලියෙන්, අනාථ කියනවා සිංහලෙන්!

Anatta, in Sanskrit it is called Anartha, in Pali it is called Anatta, in Sinhalese it is called Anātha (endangering, pestering, not leading to appeasement or any assurance).

**යමක් දුක නම්, ඒක අනාථයි! අනාථයි කියන්නේ, ඇත – නැත කියන දෙකටම අයිති නෑ!**

If something causes suffering, it is pestering, will not lead to appeasement. Not really concerned with whether it is existent or non-existent.

අනාථයි. අන්න අනාථ දකිනවා – "අනත්ථ" කිවුවේ අන්න ඒකයි.

"Anātha". That is how to clarify the word Anātha. "Anatta" means the same thing.

අල්ලන්න වටිනා කමක් නෑ, අනාථයි. ඇසුරු කළොත් ඉවරෙටම ඉවරයි, අනාතෙමයි.

Not worthy of holding on to. Distressing. Should you associate, you will be doomed. No solace, no reassurance.

අනාත කියන එක හරි, හොඳටම – ගැඹුරට ම දුක්ඛිත භාවය, අසරණ භාවය, අන්තිම පහත් ම පෙත්ත පෙන්වන එකක් තමයි අනාථ කියන වචනය.

The Sinhala word “Anātha” suits perfectly. The utmost desperation, defenselessness, helplessness all are described in the word “Anātha”.

ඉතින් ගැණු ළමයෙක් අනාථ වුනා, ගැණු ළමයෙක් අසරණ වුනා – වචන දෙකක්. අසරණ වුනොත් පිළිසරණක් වෙන්න පුළුවන්.

With regard to “Anātha”, it describes irremediable properties. It is much worse than helplessness. With a helping hand, helplessness can be alleviated.

අනාථ වුනොත්? මුලු ජීවිත කාලෙම අනාථයි කියන එකට වැටෙනවා. එහෙනම්, අනාථයි කියලා වචනේ ගන්නේ, අනාථ වුනහම! එයා හදන්න පුලුවන් එක්කෙනෙක් නෙමෙයි.

When some become subject to “Anātha”, that will be irremediable. Cannot be put right, ever.

ආන්න ඒ වගේ, අනාථයි කියන වචනයෙන් පෙන්වන යමක් ඇත්නම්, ඒකේ ගන්න – කරන්න මොනම දෙයක් වත් නෑ කියන එකයි. හදන්න බෑ, ගොඩනගන්න බෑ අනාථ වුනාට පස්සේ.

Likewise, what is described with the word “Anātha”, will have no essence to be taken out of it. Once became subject to “Anātha”, it cannot be put right again.

එහෙනම්, **මේ ලෝකේ අනාථයි!** ඉතා කෙටියෙන් ම කිවුවා නම්.

In summary the entire world is subject to Anātha. Endangering, pestering, leads to no solace.

එහෙනම්, මොනවාද අනිච්ච? මොනවාද කැමති සේ නැත්තේ?

Then what is subject to Anicca. What is not to one’s liking.

මේ ඇහැ අපි බලාපොරොත්තු වෙනවා කැමති සේ පවත්වන්න, ප්‍රිය-මනාප සේ පවත්වන්න බෑ!

This eye, we expect to keep it to our liking, we cannot keep it as likable and delightful.

අප්‍රිය-අමනාපය එනවා ට අකමැතියි, නමුත් කරන්න දෙයක් නෑ, අප්‍රිය-අමනාප ඒවා එනවා. එහෙනම්, ඇහැ අනිච්චයි!

We despise unpleasant things. But they do come our way. Inevitable. Thus the eye is subject to Anicca.

රූප? අපි කොච්චර කැමති වුනත් පවත්වන්න බෑ! අකමැති රූප එනවා,

What about visual objects? No matter how much likable, we cannot keep them. We encounter unpleasant visual objects.

නමුත් කැමති නෑ, කැමති රූප යනවා, ඒකට කැමතිත් නෑ! නමුත්, අපි කොච්චර කැමති නැති වුනත් අකමැති ඒවා එනවා, කැමති ඒවා යනවා. එහෙනම්, ඒ රූපත් අනිච්චයි!

What we like, goes away, what we don't like, comes by. Such that, the visual object too are subject to Anicca.

**"ස්ථිර නෑ" කතාව නෙමෙයි ගන්නේ, අනිච්චයි! කැමති සේ නෑ, ඉච්ච සේ නෑ!**

Has nothing to do with being impermanent, it is not to one's liking, Annica.

ඇහැ කැමති සේ නෑ, රූප කැමති සේ නෑ, කන කැමති සේ නෑ, ශබ්ද කැමති සේ නෑ, නාසය කැමති සේ නෑ, ගන්ධ කැමති සේ නෑ, දිව කැමති සේ නෑ, රසය කැමති සේ නෑ, කය කැමති සේ නෑ, ඵොට්ඨබ්බයෝ කැමති සේ නෑ, මන කැමති සේ නෑ, ධර්මයෝ කැමති සේ නෑ!

The eye, visual objects, ear, sounds, nose, odors, tongue, flavours, body, bodily sensations, mind, mental objects all are not to our liking.

එහෙනම්, ඔය ටික තමයි නාම-රූප කිවුවෙත්, මුලු ලෝකෙම කිවුවෙත්.

We refer to these things as, the mental and material things (Nāmarūpa) or the world.

එහෙනම්, **ලෝකේ අනිච්චයි කිවුවේ ඔන්න ඕකයි**.

That is why it has been said, that the world is subject to Anicca.

කැමති සේ නැත්නම්, ඒ කැමති සේ නැති එකක් කැමති සේ පවත්වන්න ඕනෑ කියලා දෘෂ්ඨියකින් ඒ පසුපස්සේ යනවාද, ඒ තරමට ම එන්නේ දුක!

If something is not to one's liking, should one try to keep things to his liking, thinking falsely that he's supposed to and is able do that, the end result would be nothing but suffering.

එහෙනම්, මේ ලෝක සත්ත්වයා කරන්නේ ඕක. එහෙනම්, **ලෝකයා අනාථයි!**

But the inept worldly being do just that. So they are very much vulnerable.

සත්‍යය දන්නේ නැති ලෝකයා, අනාථයක් තුළ ගොඩනඟනවා. අනාථයක් තුළ සැරිසරමින්, පිළිසරණක් හොයනවා.

The worldly beings without knowing the truth, try to build up their own world. Looking for some solace, in a world, which is inherently pestering and punishing.

අනාථයක කොහොමද පිළිසරණක් හම්බ වෙන්නේ? අන්න යථාර්තය.

How can one seek solace, in such a world? This is the truth.

(ශ්‍රාවක මහතෙක්): ලෝකයා අසරණයි, ධර්මතා අනාථයි!

A listener: The worldly beings are helpless. By convention/ norm, the world leads to distress and hopelessness.

(ස්වාමීන් වහන්සේ): ඔවු, දැන් දෙකම අහු වෙනවා නේ, දැන් ලෝකය අසරණ වෙලා තියෙන්නෙත් ඒක නේ, සරණක් නෑ!

Waharaka Thero: Yes, now both can be seen. This is why we call that the worldly beings are helpless.

සරණක් නැති දේ අල්ලන්න ගිහාම ගිය එක්කෙනා අනාථ වෙනවා, ඒකනේ සිද්ද වෙන්නේ.

When someone hold on to something punishing, that's what happens?

අනාථයෙන් මිදුනා නම් නාථයි. අන්න, **අනාථ – නාථ දැක්කා නම්, බුදුන් දැක්කා!**

If you get your self-freed from such distress, you see the solace. You see Buddha, who lends the helping hand for the helpless.

දැන් ධර්මය තුළින් බුදුන් දැක්කා නේ, **"යෝ ධම්මං එස්සති, සෝ මං එස්සති"** – දැක්කේ නැද්ද?

From Dhamma you see Buddha.

"He who sees Dhamma, sees me (Yo Dhammam passati so mam passati)"

අන්න අනාථ – නාථ දැක්ක දාට බුදුන් දැකලා, ධර්මය දැක්කා. එහෙනම්, ධර්මය තියෙන්නේ ඔතන නේද?

So when you see the Buddha's reassuring helping hand, you see Buddha, you see Dhamma. Then isn't this Dhamma?

එහෙනම් ඉතින්, ඔය අනාථ – නාථ දකින්න තියෙන ධර්මය පැත්තක තියෙද්දී, ඔය පොඩ්ඩ දැකගන්නේ නැතුව, අපි මොනවාද මේ – මොනවාද අපිට කරන්න තියෙන්නේ?

Without grabbing the helping hand the Buddha lends us, without seeing the Dhamma, what are we doing? What should we be doing?

ඉතින් ඔය ටික දැනගන්න බැරිද? එදා මේ පුන්නා දාසිය නිවන් දැක්කේ ඔය ඔය පොඩ්ඩ තෝරාගන්න පුළුවන් හින්දා නේ, හත් අවුරුදු දරුවොත් නිවන් දැක්කේ!

So can't we see this much. Punna Dasi, got enlightened seeing this much. Even seven year olds, attained the liberation after seeing this much.

**(ශ්‍රාවක මහතෙක්): ඒකට දහම් ශක්තිය වැඩිලා, බෝධි පාක්ෂික ධර්ම වැඩිලා සම්පූර්ණ වෙලා තියෙන්නට ඕනේ නේද?**

A listener: For that shouldn't they have already got the conditions conducive to enlightenment, accumulated in themselves up to the required thresholds?

**(ස්වාමීන් වහන්සේ): නෑ ඉතින්, ඔක අපිට නෑ කියන අය – අද නෑ කියන්න පුලුවන් ද? ඕන තරම් ඉන්නවා!**

Waharaka Thero: True, but how can we say, such people, who have already gathered enough energy are not around anymore? This little much of Dhamma, still has to be clarified.

**ඔය පොඩ්ඩ නේ පෙන්නා ගන්න ඕනේ, ඔය පොඩ්ඩ පොඩි වුනාට ලොවුතුරා බුදුරජාණන් වහන්සේ නමක් පෙන්වනකන් හැඟවිලා!**

It may seem so little, but this much lies hidden until a Lord Buddha comes and shed light upon it for us to see.

මේක වටිනාකම එච්චර ලොකුයි! ඒ නිසා මේ වචන තුන ලෝකේ හැඟවිලා තියෙන වචන තුනක්.

The value of these three words are that much great. Thus, more or less they remain hidden.

ලොවුතුරා බුදු වරයෙක් ම ඕනේ මේක විද්‍යාමාන කරන්න.

We need a rightly self-awakened Lord Buddha to make them visible to us.

ඒ තරම් වටිනවා. මේ වටිනා වචන තුන, අර්ථය හැඟවිච්ච නිසා අපිට අත්‍යාවශ්‍යය හරය – මහා හරයක් ලබාගන්න තියෙන එක වැහිලා තියෙනවා. මෙන්න නිවන් හරය වැහිලා තියෙන තැන.

That much precious. Since the underlying meanings got distorted with time, we were unable to access the essence of Dhamma, the kind of Dhamma, which grants Nirvana.

(ශ්‍රාවක මහතෙක්): ඒක තමයි, පටිසම්භිදා ඥාණ සහිත රහතන් වහන්සේලා නැති අඩුපාඩුවක් ද තියෙන්නේ?

A listener: Is it because of the lack of Arahants with the skills for the four discriminations?

(ස්වාමීන් වහන්සේ): අඩුපාඩුව! එතනින් නේ ඕක මතු වෙලා එන්නේ, යථාර්තය මතු කරගන්නේ ඒකෙන්. ඉතින් ඔය ටික අපිට තේරුම් ගන්න ඕනේ. අන්න දැන් අපි දැනගන්නවා වචනයේ පදාර්ථය හරියටම. නිරුක්තිය දැක්කා, එතකොට අන්න ඒ වචනය තුළ ම තියෙනවා අර්ථය!

Waharaka Thero: That was the shortage. From the four discriminations (artha, dharma, nirukthi, patibhāna) only one is able to uncover the truth. Now that we know the linguistic expression of the Dhamma words, we'll come to understand its underlying meaning.

ඔය වචනයේ තියෙන අර්ථය පැත්තකින් දාලා, අපි ඕකට වෙන වෙන අර්ථ පටලවාගෙන කියන්න ගිහාම,

Without understanding the correct underlying meaning, when we mix up things, confusions arise.

අර **"ජින්න – භින්න පට ධාරේතීති, භික්ඛු"** කියලා පෙන්වනවා. **"භික්ඛාටණේන භික්ඛු"** කියලා කියනවා.

For example, the meaning of the word "Bhikkhu" has been clarified as the one who holds worn out and broken bowls and lives by begging.

එක්තරා **හිඟන්නෙක් කිවුවාලු, "'එහෙනම් මටත් වැඳපල්ලා – පුදපල්ලා"** කියලා.

Then a beggar too asked everybody to bow down in front of him.

ඇහුවා ලු මොකද? කියලා, "ජින්න භින්න පට දරන භින්දා භික්ෂුව කියනවා නම්, මමත් මේ සිදුනු – බිඳුනු ඒවා තමයි දරන්නේ, ඉතින් මං භික්ෂුවක් වෙන්න එපැයි එහෙමනම්!

Then he said that, he too is holding worn out, broken bowls, thus he should also be a Bikkhu.

භික්ඛාටනේන භික්ඛු – මාත් හිඟා කාලා තමයි ජීවත් වෙන්නේ. ඉතින් ඒ නිසාත් භික්ෂුවක් වෙන්න එපැයි, එහෙනම් මටත් වැඳපලා – පුදපල්ලා, මාත් භික්ෂුවක්!" කිවුවා ලු.

He also said that, he too is living by begging. So he claimed to be bowed down at and venerated as a Bhikkhu.

දැන් නෑ කියන්නද? සිදුනු – බිඳුනු පට දරන හෙයින් භික්ඛු කියනවා – ඡින්න භින්න පට ධාරේතීති භික්ඛු. දැන් තෝරලා තියෙනවා.

Now how can we deny the beggar's request. The word "Bhikkhu" has been clarified as the one who holds worn out and broken bowls.

භික්ඛාටනේන භික්ඛු – භික්ඛාටනය කරනවා කියන්නේ පිඬු සිඟා ගන්නවා.

The word "Bhikkhu" has been clarified as the one who lives by begging.

ඒ නිසා භික්ඛු කියනවා කියලා ඔය තෝරනකොට, අර හිඟන්නා කියනවා, "එහෙනම් මාත් භික්ෂුවක්!" ඒ අර්ථයෙන් බැලුවොත්. "ඉතින් භික්ෂුවකට කරන ඇප උපස්ථාන මටත් කරපල්ලා කෝ!" කිවුවා.

So according to the beggar and also by that definition given, he claimed to be attended to and be venerated similarly.

දැන් ඉතින් එහෙම නෑ කියන්න යෑ ඔය වචන වලින් භික්ෂුව තෝරන්න ගියොත්?

If that is the definition given, can we really deny the beggar anything less than what he claims.

අන්න, පද නිරුක්තියක් තියෙනවා. **"භික්ඛු" කියන එකේ නිරුක්තියක්, ඒක දැක්කේ නැති නිසයි ප්‍රශ්නේ තියෙන්නේ.**

There is a certain linguistic expression to the word "Bhikku". The problem stems from not seeing that.

**"භික්ඛු" – "භි" කියන්නේ භවය, "ඛු" කියන්නේ ඛය කරනවා,**

"Bhi" means the being. "Khu" means weakening.

**"භවය ක්ෂය කරන හෙයින් භික්ෂුව" කිවුවා නම්, හිඟන්නා ට කියන්න පුලුවන්ද මාත් භවය ක්ෂය කරනවා කියලා?** ඌ භවයේ ඇලිලා ඉන්නේ.

Bhikku as in, in the process of weakening the being. With such a definition, can the beggar claim to be a "Bhikkhu"? The beggar is affixed in the being.

**භවය ක්ෂය කරගෙන යන කෙනෙක් ඇත්නම්, ඒ මාර්ගයේ යනවා නම්, එයා භික්ඛු!**

If there is someone, who is in the process of weakening the being, following such path that enables just that, that someone can be called a "Bhikkhu".

හැබැයි, භවය ක්ෂය කරන එක "භික්ඛු" කියන වචනයේ තියෙනවා, නිරුක්තිය. පද නිරුක්තිය ඒකයි.

The word “Bhikku” has its lingusitic expression hinting towards its underlying meaning.

පද නිරුක්තිය ගන්න නම්, සිවු පිළිසිඹියා – අර කියන අත්ථ පටිසම්භිදා ඥාණයෙන් ගන්න ඕනේ.

The correct linguistic expression, should come from the knowledge of meaning, a part pf the four-fold knowledge of discrimination.

(ශ්‍රාවක මහතෙක්): මට වැටහෙන්නේ, ඔබ වහන්සේ තුළ ඒ ඥාණය වඩලා තියෙනවා

A listener: Venerable Sir, I can see that you have acquired such knowledge of discrimination.

(ස්වාමීන් වහන්සේ): එක්තරා මට්ටමක් තියෙනවා, ඉතින් මං නෑ කියන්නේ නෑ, පේන්න තියෙන දේ නොකියා බැරි නිසා කියනවා.

Waharaka Thero: To some extent, I will not say no. I cannot deny something that is apparent.

ඒ නිසා තමයි මං ඒ වචන – පද දීලා, නියම යථාර්තය මතු කරලා දෙන්නේ.

That is why I point out key Dhamma words and take out the real meaning that lies underneath.

ඉතින් ඒ නිසා කියන්නේ, ඒකේ තියෙනවා යම්කිසි ආකාරයකින් තේරුම් ගන්න, ඔය යථාර්තය තේරුම් ගන්නේ ඔය ක්‍රමයෙන්.

So there is a method to decipher the words to understand the truth conveyed by Dhamma.

ඉතින් භික්ඛු කියන එකට ඔය මං කිවුව එක, **පදය හොඳට පැහැදිලියි මතු කරලා දුන්නාට පස්සේ, නමුත් පොත්–පත් වල නෑ, භික්ඛු කියන එකට එහෙම අර්ථය දීලා!**

Accordingly, I have deciphered the word “Bhikkhu”. But this has not been written in any books of reference, in any Dhamma commentaries as such.

භවය ක්ෂය කරන – ඛු කරනවා කියන්නේ ක්ෂය කර දමනවා, පහත් කර දමනවා, නින්දිත දෙයක් බවට පත් කරලා නිස්සාර දෙයක් බව තේරුම් කරලා දෙනවා. අන්න, භික්ඛු වෙන හැටි!

“Khu” means weakening, discrediting, taking as something disgraceful, futile. When someone does that to the being, such person becomes a “Bhikkhu”.

ඉතින් ඕකට ඡින්න – භින්න පට දරන හින්දා භික්ඛු කිවුවාට හරියන්නේ නෑ! භික්ඛාටනය කරන හින්දා භික්ඛු කිවුවාට හරි යන්නේ නෑ!

Saying a “Bhikkhu” is someone who holds worn out and broken bowls and lives by begging, will not really work.

භවය ක්ෂය කර දමන්නා වූ වැඩපිළිවෙලට බැහැපු නිසා භික්ඛු කියනවා කිවුවොත් ගැලපෙනවා. ඒක හිඟන්නාට තියා, මේ ලෝකේ කාටවත් කියන්න බෑ භික්ඛු කියලා එතකොට එහම නැති කෙනෙකුට. අන්න ඒ වගේ දෙයක් ඔය තියෙන්නේ.

However, when we say a “Bhikkhu” is the one who follows the path of weakening the being, not the beggar, not anyone, other than someone who objectively does that, can claim to be a “Bhikkhu”.

ඉතින්, “යදනිච්චං තං දුක්ඛං – යං දුක්ඛං තදනත්තා” දැන් ඕක, **ඔච්චරයි තෝරා ගන්න තියෙන්නේ!**

“Yada nichchan – than dukkhan; yan dukkhan – thadanaththa”. Now this phrase is all you have to get clarified.

දැන් ඔතන මුලු ධර්මය දැක්කා, අනාථ බව දැක්කා, නාථ බව දැක්කා. මොකද්ද නාථ?

Now you have seen all of Dhamma. You see what is pestering and what is comforting or reassuring.

එහෙනම්, කාම ලෝකය බැලුවාත් තියෙන්නේ ඔය අනිච්ච – දුක්ඛ – අනත්ථ කොටසමයි.

The sensuous world (Kama-Loka) is subject to Anicca, Dukkha, Anatta.

රූප ලෝකෙට බැලුවත් අනිච්ච – දුක්ඛ – අනත්ථ කොටස මයි.

The fine material world (Rupa-Loka) is subject to Anicca, Dukkha, Anatta.

අරූප ලෝකෙට බැලුවත් අනිච්ච – දුක්ඛ – අනත්ථ කොටස මයි.

The immaterial world (Arupa-Loka) is subject to Anicca, Dukkha, Anatta.

එහෙනම්, **කාම ලෝක අනාථයි, රූප ලෝක අනාථයි, අරූප ලෝක අනාථයි,**

Then the sensuous world is pestering, the fine material world is pestering, the immaterial world is pestering.

සියළුම ලෝක වල තියෙන්නේ ඔච්චරයි – **සියළු ලෝක අනාථයි!** එහෙනම් මොකද්ද කරන්න ඕනේ?

All worlds are pestering. Then what should we do?

ඕක අල්ලාගෙන ඉන්න යම් ඡන්ද රාගයකින් බැඳිලා ඉන්නවා නම්, ඔන්න ඕක අතැර ගිය දාට ඒකයි නාථ! **අතහැරීම නාථයි,** අපිට ඕනේ අතහැරගන්න.

If we are holding on to a being in these worlds with a longing for sensual desires, when such holding on comes to cease, now that is the true reassurance. Then disenchantment is reassuring. We have to effect disenchantment.

**අතහැරීම නාථයි, අතහැරීම වෙත්වා! නොඇල්ම නාථයි, නොඇල්ම වෙත්වා! මිදීම නාථයි, මිදීම වෙත්වා! නිවන ම නාථයි, නිවන ම වෙත්වා!**

Disenchantment is reassuring, may disenchantment come about! Dispassion is reassuring, may dispassion come about! Emancipation is reassuring, may emancipation come about! Nirvana is reassuring, may Nirvana come about!

අන්න, පැතුමයි, ධර්මයයි, දෙකම එනවා. ධර්ම ආවර්ජනය වෙනවා, ලෝකයේ ආදීනව දකින්න ඕනේ, නිවනේ ආනිසංස දකින්න ඕනේ, මෙන්න මාර්ගය වැඩෙන හැටි!

There's what you should aspire. The aspiration and Dhamma both are included. Dhamma is reflected on. The bad consequences of the world are reflected on. The virtues of Nirvana are reflected on. This is how, one's Noble path is developed.

දැන් අපි ලඟ, අනාථය අනාථය හැටියට දැක්කාට පස්සේ පහ කළ යුතු දහමක් අපි දකිනවා.

Now when'll have seen, what's pestering, we see what we should not associate with.

**"පස්සාස"** කළ යුතු දහමක්! **පස්සාස කරනවා කියන්නේ, පහ කරනවාටයි** පස්සාස කරනවා කියන්නේ.

What dhamma/ mental qualities needs to be avoided or expelled. "Passasa" means to expel.

එනකොට මොකද්ද ඇසුරු කරන්න ඕනේ?

Then what should we associate with?

නාථත්වය! **අතහැරීමක් ඇත්ද, නොඇල්මක් ඇත්ද, මිදීමක් ඇත්ද, යථාවබෝධය ලබා ගන්නා වූ ධර්ම මාර්ගයක් සිහි කිරීමක් – ආවර්ජනයක් ඇත්ද, ඒක තමයි ආස්සාස දහම**.

We have to associate what's objectively reassuring. If there is some disenchantment, dispassion, some path facilitating the enlightenment, some reflection, some recollection, that is the dhamma/ mental qualities to associate.

මෙන්න මේ දහම ආස්සාස කරමින්, ලෝකයේ මෙච්චර කල් ගත්ත අවිද්‍යාසහගත දහම පස්සාස කරමින් කටයුතු කරපු, ඔය අස්සාස – පස්සාසයත් ඔය ආනාපානයෙන් යුක්ත එක්කෙනා නිවන් දකිනවා.

We have to associate with these dhamma/ mental qualities closely. "Assa" means to associate with. Have to expel the false thinking that we used all this while. The one who wisely associate with the dhamma/ mental qualities conducive to Nirvana, and expel whatever impedes it.

ඔන්න **ආනාපාන භාවනාව, අස්සාස – පස්සාස භාවනාව.**

This is the correct Ānāpānasati meditation, Assāsa-Passāsa meditation.

දැන් ඔය වෙන එකක් කරලා හරි යයිද? දැන් ආනාපානය කියලා හෝ, අස්සාස – පස්සාසය කියලා හෝ බඩ පුම්බලා – හකුළලා හරි, නාහෙට හුස්ම අරගෙන ඇරලා හරි ඔය ටික වෙනවා ද?

Ānāpānasati meditation has nothing to do with respiration, breathing in and out, expanding or shrinking your belly. Those are misconceptions.

පහ කළ යුතු දහම තේරුම් අරන් පහ කරලා දැම්මොත්, ඒ ඇසුරු කළ යුතු වන්නාවූ ධර්මය ඇසුරු කරමින් නිවන ඇසුරට ගත්තොත්, එයා නිවන් දකින්නේ නැද්ද?

If one wisely associates with the mental qualities condusive to Nirvana, and expels the mental qualities impeding it, shouldn't he end up with Nirvana?

එතන නිවන් දකිනවා – හේතු තියෙනවා.

He will attain Nirvana. Because he is creating right conditions for the Nirvana to come about.

හැබැයි හුස්මෙන් උඩට අරගෙන – පල්ලෙහාට අරගෙන නිවන් දකින ක්‍රමය මොකද්ද ඇහුවොත් එහෙම, මොනවා කියන්නද? ඕකට මොනවා ගැටගහන්න ගියත් හරියන්නේ නෑ.

But how can the path to Nirvana be explained for the respiration methodology. In whatever you try to explain, it will not be logical.

අන්න අපි දැනගත යුතු දේ! තණ්හාව යම් තැනක ද උපදින්නේ, ගෙවෙන්නෙත් එතන, ක්ෂය කළ යුත්තෙත් එතන.

This is what we have to know. If desire arises somewhere, that is when it will come to pass and that is where it should be weakened.

**"ඡක්ඛු ලෝකේ ප්‍රිය රූපං – සාත රූපං, එත්තේසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ත නිවිස්සමානා නිවිස්සති"**

"Chakkhu loke priya rupan – satha rupan, eththesa thanha upajjamana uppajjathi, eththa niwissamana niwissathi"

මෙන්න තණ්හා උපදින තැනක්. ඇහැ ලෝකේ ප්‍රිය ස්වභාවයෙන් යුක්තයි, මධුර ස්වභාවයෙන් යුක්තයි. ඒ තෘෂ්ණාව එහි උපදිනවා, එහි පවතිනවා.

Here is one place where the desire is arisen. The world is likable and delightful. The desire arises there and persists there.

"එත්ත නිරුජ්ජමානා නිරුජ්ජති" – එතන මයි නිරුද්ධ කරන්න පුලුවන්. අන්න, උපන් තැන ම නිරුද්ධ කරන්න ඕනේ.

"Eththa nirujjamana nirijjathi" that is where its rising can be stopped. The arising should be stopped, exactly where it is originated.

එහෙනම් ඇහේ උපදින තෘෂ්ණාව, ඇහැ නිසා උපදින තෘෂ්ණාව ඇහැ මුල් කරගෙනයි හටගන්නේ. එතන මයි ඒක නිරුද්ධ කරගන්න ඕනේ.

Then the desire that is emerged in the eye, the desire that is emerged due to the eye, emerges based on the eye. That is where its emerging, should be stopped.

**"රූපං ලෝකේ පිය රූපං – සාත රූපං, එත්තේසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ත නිවිස්සමානා නිවිස්සති"** – "නිරුජ්ජමානා නිරුජ්ජති" කියන්නේත් එතන!

""Rupan loke priya rupan – satha rupan, eththesa thanha upajjamana uppajjathi, eththa niwissamana niwissathi – nirujjamana nirujjathi" means the same thing.

(ශ්‍රාවක මහතෙක්): නිරුද්ධ කිරීමක් මිස යටපත් වීමක් නෙමෙයි!

A listener: It is the stopping of something from emerging (Nirodha), not as suppressing something, isn’t it?

(ස්වාමීන් වහන්සේ): යටපත් නෙමෙයි! යටපත් කරන්න එකක් තියෙන්න එපැයි!

Waharaka Thero: No, it’s not about suppressing something. To suppress, there should be something, isn’t it?

තියෙන එකක් කොහෙද තියෙන්නේ? **තියෙනවා කිවුවොත් ආත්ම දෘෂ්ඨිය නේ! හේතු – ඵල ක්‍රියාකාරීත්වයක් හදාගෙන තියෙනවා අවිද්‍යාවෙන්,**

Where is the thing that is existent? If we say it’s existent, we fall on to the Eternity-belief. Because of ignorance (Avidya), a continuum of cause and effects has been manifested.

**ඔය ක්‍රියාකාරීත්වය නිරෝධ කරනවා.**

This continuum of cause and effects is discontinued.

රෝද කියන්නේ කරකවාගෙන යනවා ඒ පස්සේ, රවුම් ගහනවා. නිරෝධ කරනවා කියන්නේ රවුම් ගහන එක නතර කරනවා.

In Sinhalese “Roda” is rounding behind something, the rotation. “Nirodha” means to stop rounding behind something, stopping the rotation of the cycle.

ඇති එකක් පස්සේ ගියෙත් නෑ, නැති කතාවකුත් නෑ! එහෙනම්, **නිරෝධ කරනවා කියන්නේ නැති කරනවා නෙමෙයි.**

Didn’t roam behind something existent. Not about anything non-existent as well. Then “Nirodha” does not mean to wipe out something.

නැති කරනවා කිවුවොත් ඇති කරපු දෙයක් තියෙන්න ඕනේ. ඇත – නැත කියන අන්ත දෙකක් ඒක!

To wipe out something, there should be something that is existent. Existent and non-existent are two extremes.

අන්න, **රෝද කියන එකේ අනික් පැත්ත – නිරෝධ, චක්‍රය නතර කරනවා.** “Nirodha” is the opposite of “Rodha”. We are stopping the rotation.

**චක්‍රයක් නිසා විද්‍යාමාන වෙනවා, චක්‍රය නැත්නම් නතර වෙනවා.**

චක්‍රය අපි ක්‍රියාත්මක කරනවා නේ, මොහොතක් ගානේ. අවිද්‍යාවෙන් කරන වැඩපිළිවෙල ඕකනේ.

Because of the rotation, the cycle is manifested. Without the rotation, the cycle will stop.

We are rotating the cycle each moment. This is the activities (of mind, word and body) driven by Avidya or ignorance.

මේ අපි විසින් කරන වැඩපිළිවෙලක් නිසා අපි දුක් විඳිනවා මිසක්, වෙන එකක් කරනවාද?

We are suffering because of our own activities, nothing else.

නිරෝධ කරනවා කියන්නේ රවුම් ගහන එක නතර කරනවා. ඊට පස්සේ ඒක රවුම් ගහන්නේ නෑ. අන්න නතර වුනා.

Nirodha means to stop rounding. Thus it is stopped.

දැන් අපි ඔය බලන්න ඔය වචනය අහන හැටි, "කොහේ කොච්චර රවුම් ගහන්න ගිහින් ආවා නේද මෙතන!" අර පැරණි අය තවත් බණිනවා. "කොහෙද රවුම් ගහන්න ගියේ? ගියාද රෝන්දේ ගහන්න?" අන්න අහන වචනයක්.

Now see, people use this word in their day today activities, "Where have you been rounding"?

"රෝන්දේ" – රෝ කියන වචනයෙන් පෙන්වන්නේ රෝද කරනවා. රෝද කරන්න ගියොත් අන්ධ වෙනවා, අවිද්‍යා අන්ධකාරයට වැටෙනවා.

In the Sinhala word "Ronde" (Ro + andha), "Ro" signifies rounding, and "Andha" means blind.

එහෙනම්, රවුම් ගහන්න ගිහිල්ලා අන්ධ වෙන එක්කෙනාට, රෝ + අන්දය – රෝන්දේ යනවා.

If you are rounding behind something, you become blind with the darkness of ignorance.

රෝන්දේ යනවා කියන වචනය අපේ නිකන් පැරණි වචනයක් වගේ පෙනුණාට, **බලන්න දහම් වචනයක් තියෙන්නේ. රවුම් ගහන්න ගිහින් අන්ධ වෙන්න එපා! රෝන්දේ යන්න එපා! රෝන්දේ ගහන්න එපා!**

The Sinhala word "Ronde" might seems somewhat ancient, but it has a deep meaning from Dhamma perspective.

අන්න වචනයේ අර්ථ ආපු හැටි. අන්න නිරුක්තිය, රෝ + අන්ද – රෝන්ද.

This is how the meaning is derived. That is the linguistic expression. "Ro+ andha = Ronda".

"රෝ" කියන්නේ සැරි සරණවා. "නිරෝ" නෑ, "රෝ!" අපි නිරෝ පැත්තට යන්න ඕනේ ඒක නැති කරගන්න. ඉතින් මේ නිරෝධ වෙනවා කියන්නේ අන්න ඒකයි.

"Ro" means to roam around. "Niro" means not to roam around. We have to go towards, not roaming around to stop. So "Norodha" means this.

දැන් අපිට ආවා කර්මස්ථානයක් ඔතනත්. මෙච්චර වෙලා අහපු එක,

Here too we have derived ourselves with a meditational phrase. What we have been listening to thus far.

**"කාම ලෝක අනාථයි, රූප ලෝක අනාථයි, අරූප ලෝක අනාථයි, සියළු ලෝක අනාථයි, අතහැරීම නාථයි, අතහැරීම වෙත්වා! නොඇල්ම නාථයි, නොඇල්ම වෙත්වා! මිදීම නාථයි, මිදීම වෙත්වා! නිවන ම නාථයි, නිවන ම වෙත්වා!"**

The sensuous world is pestering, the fine material world is pestering, the immaterial world is pestering. All worlds are pestering. Disenchantment is reassuring, may disenchantment come about! Dispassion is reassuring, may dispassion come about! Emanicipation is

reassuring, may emanicipation come about! Nirvana is reassuring, may Nirvana come about!

දැන් ආස්සාස දහමත් තියෙනවා, අතහැරීම නාථයි – අතහැරීම වෙත්වා, නොඇල්ම නාථයි – නොඇල්ම වෙත්වා, මිදීම නාථයි – මිදීම වෙත්වා, නිවන ම නාථයි – නිවන ම වෙත්වා – ආස්සාස දහම.

We have the Dhamma we should associate with. Disenchantment is reassuring, may disenchantment come about! Dispassion is reassuring, may dispassion come about! Emanicipation is reassuring, may emanicipation come about! Nirvana is reassuring, may Nirvana come about! The dhamma/ mental qualities to associate with.

කාම ලෝක අනාථයි, රූප ලෝක අනාථයි, අරූප ලෝක අනාථයි, සියළු ලෝක අනාථයි – පස්සාස දහම.

The sensuous world is pestering, the fine material world is pestering, the immaterial world is pestering. All worlds are pestering – The dhamma/ mental qualities that we should expel.

දැන් ඔය ආස්සාසයයි පස්සාසයයි ඔය කර්මස්ථානය තුළ තියෙනවා.

This meditational phrase helps us to reflect on what we should associate and what we should expel.

දැන් **ඕක කරගෙන යනකොට ආනාපානය සිද්ධ වෙනවා.**

Now while we are reciting this meditational phrase reflecting wisely on the Dhamma, we are practicing the Ānāpānasati meditation.

ඉතින් ආනාපානයේ යන කෙනාට අමුතුවෙන් නිවන් මඟ කියන්න දෙයක් නෑ,

The one who is following the Ānāpānasati, should not be taught the Path to Nirvana exclusively.

ධර්මයෝ – ධර්මයෝ පවත්වනවා! ඉතින්, "**ධර්මයෝ ධර්මයෝ පවත්වයි, නිර්වාණ පර තෙරට යාම සඳහා ධර්මයෝ ම ධර්මයෝ පුරවයි**"

"In this way, mental qualities (Assasa Dhamma/ Dhamma that we should associate with) lead on to mental qualities, mental qualities bring mental qualities to their consummation, for the sake of going from the near to the Further Shore."

**– න චේතනා කරණීය සූත්‍රය** හොඳට විස්තර කරලා තියෙනවා, අමුතුවෙන් කරන්න දෙයක් අපිට නෑ කියලා.

This has been described in the "Na Chetana Karaniya Sutta". We don't have to do anything exclusive.

(ශ්‍රාවක මහතෙක්): නිවන් දැක්කා කියන්නේ ... ධර්මයන් ගේ මතු වීමක්.

A listener: To achieve Nirwana is the emergence of certain mental qualities.

(ස්වාමීන් වහන්සේ): ඔවු! මතු වෙලා එන එක. ඉතින් මුල හරි නම් අග මතු වෙනවා.

Waharaka Thero: Yes, if we have got the right conditions in the beginning, it will lead on to the next and the end will be brought about. It's bound to happen.

(ශ්‍රාවක මහතෙක්): සෑම චිත්තක්ෂණයක් පාසා ම ධර්මතාවය තමයි මතු වෙන්නේ.

A listener: With each “Chiththakshana” (instance/ infinitesimal amount of mind), the convention (norm, protocol/ law and order) is manifested.

(ස්වාමීන් වහන්සේ): අන්න ඒකයි කියන්නේ!

Waharaka Thero: That’s what we are talking about.

ඉතින් ඒ නිසා, ඒ මොහොතක් පාසා ම. ඉතින් දැන් මහත්මයා අභිධර්මය ගැන දන්න කෙනෙක් නේ, හදාරපු කෙනෙක් නේ, දැන් එක චිත්තක්ෂණයක් තුළ, පටිච්ච සමුප්පාද චක්‍ර 16ක් වැඩ කරන බව පෙන්වපු තැනක් අපේ ධර්මයේ තියෙනවා.

Therefore, in each instance. Now you as a person who has knowledge of Abhi-Dhamma, you might know, in Dhamma it has been said that in each Chiththakshana, there are 16 dependent origination cycles.

දැන් අපිට එහෙනම්, පටිච්ච සමුප්පාදය තෝරන්න පුලුවන් ද ගිහිල්ලා නිකන් ලේසියට?

Then will we be able to get the doctrine of dependent origination clarified that easily?

එක චිත්තක්ෂණයක් පටන් ගත්ත තැන, “උප්පාද” වෙලා, “ඨිති” වෙලා, “භංග” කියන අවස්ථා තුනට යන්න ඉස්සෙල්ලා, “ඨිති” සම්පූර්ණ වෙනකොට, හතර ආකාරයකින් වැඩ කරන පටිච්ච සමුප්පාද චක්‍ර 4ක් ක්‍රියාත්මක වෙනවා.

Each chiththakshana, before completing its arising, persisting and passing away, by the time the persisting is completed, four dependent origination cycles take place that work in four different ways.

දැන් අද නම් අවිද්‍යා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං... ආදී වශයෙන් සූත්‍ර පිටකයේ තියෙන එකක් විග්‍රහ කරන්නේ.

We mainly discuss the twelve linked dependent origination cycle clarified in the Pitaka of discourses.

නමුත්, **විභංගප්‍රකරණයේ, පච්චයාකාර විභංග** කියන කොටසක් තියෙනවා. ඒ කොටසේ තියෙනවා සම්පූර්ණ ම මේක ක්‍රියාත්මක වෙන හැටි.

But in the “Vibhangaprakaranaya” (Book of treatises on Divisions), there is a division for causal genesis (Pachchayakara) which explains the detailed process.

දැන් මේ මේක අති සූක්ෂම විද්‍යාවක්. **අභිධර්මය අහක් කරලා නිවන් දකින්න, මේ නිවන් දකින්න නෙමෙයි, ධර්මය යටපත් වුනොත් එහෙම ගොඩනගන්න විදිහක් නෑ! ඒක විශේෂඥ ධර්මයක්, වහගත්තහාම ඇරගන්න තියෙන්නේ එතනින්.**

This is extremely intricate, expert knowledge. Do attain Nirvana, without bothering about Abhi Dhamma. This is not for the attainment of Nirvana. Should be used in the case of Buddha Dhamma being suppressed, to revive it.

දැන් අපි අහනවා, **“ආයතන”** කියන්නේ මොනවාද? අහපුහාම, සූත්‍ර පිටකය බලාගෙන ගිහාම, කිසි තැනක අටුවාවක වත් විග්‍රහ කරලා නෑ ආයතන මොනවාද?

If someone asks what is “Āyatana”, we cannot identify any definition in the discourses, nor in any other commentaries.

ඇස ආයතනයක්, කන, දිව, නාසය, ශරීරය ආයතන හැටියට පෙනවනවා – සළායතන. **ඇස – කන – දිව – නාසය – ශරීරය – මන සළායතන** කියනවා.

The eye, ear, tongue, nose, body and mind is shown as the “Āyatana”, or the six sense bases.

දැන් අපි අහනවා, බුදුරජාණන් වහන්සේ සළායතන නිරොධ කරා ද නැද්ද? කියලා

We know that the Lord Buddha effected the cessation of six sense bases.

**“අවිද්‍යා යත්තේව අස්සේස විරාග නිරෝධා සංඛාර නිරෝධෝ, සංඛාර නිරෝධා විඤ්ඤාණ නිරෝධෝ, විඤ්ඤාණ නිරෝධා නාම–රූප නිරෝධෝ, නාම–රූප නිරෝධා සළායතන නිරෝධෝ..”**

With the complete eradication and cessation of ignorance, willful acts/ volitional thoughts ceases;
with the cessation of willful acts/ volitional thoughts, consciousness ceases;
with the cessation of consciousness, mind-body cease;
with the cessation of mind-body, the six sense bases cease;

උන්වහන්සේ අවිද්‍යාව ශේෂයක් නැතුව විරාගයෙන් නිරෝධයට පත් කරපු උත්තමයෙක් ද නැද්ද? කියලා අහපුහාම නෑ කියන්නද?

Lord Buddha has eradicated ignorance fully, with detachment. One cannot deny it.

අවිද්‍යාව ශේෂයක් නැතුව විරාගයෙන් නිරෝධයට පත් කරලා තමයි සළායතන නිරෝධ කරලා තියෙන්නේ.

After eradicating ignorance fully, with detachment, the six sense bases have been ceased.

සළායතන කියන්නේ ඇස – කන – දිව – නාසය – ශරීරය – මන නම්, ඇස – කන – දිව – නාසය – ශරීරය සළායතන නම්, **ලොවුතුරා බුදුරජාණන් වහන්සේට බුදු වුනාට පස්සේ 45 අවුරුද්දක් ඇස – කන – දිව – නාසය – ශරීරය – මන තිබුණේ නැද්ද? ඇහුවොත් මොකක් කියන්නද?**

If “Āyatana” are the six sense bases, didn’t the Lord Buddha have the eye, ear, tongue, nose, body, mind during the 45 years he lived following attaining the supreme enlightenment. If one questions what can we say?

අන්න ඒකනේ වෙන්නේ, කෝ ධර්මය කොහොමද දෙන්නේ? සූත්‍ර පිටකයෙන් විතරක් තෝරන් ගියොත් අභිධර්මය අහක් කරලා, කොහොමද ඕක තෝරන්නේ?

See one cannot interpret Dhamma using the Discourses only, without Abhi- Dhamma one cannot clarify what “Āyatana” is.

එහෙනම්, ඕක තෝරා ගන්න එකක් සූත්‍ර පිටකයේ නෑ, ඕක තියෙනවා “**විභංග ප්‍රකරණයේ**“. “චක්ඛු චක්ඛායතන වේද, චක්ඛායතන චක්ඛු වේද?” ප්‍රශ්න දෙකක් අහලා උත්තරේ දෙනවා.

In the “Vibhangaprakaranaya” (Book of treatises on Divisions), two questions are asked.

“Is Chakku(eye), the Chakkhaytana? Is Chakkhaytana, the Chakku(eye)?”

“චක්ඛු චක්ඛු වේ – චක්ඛායතන නොවේ, චක්ඛායතන චක්ඛායතන වේ – චක්ඛු නොවේ” කොච්චර ලස්සනට තෝරලා තියෙනවාද? දැන් කොහොමද, **අභිධර්මය අහක් කරලා එහෙනම් තෝරන්න පුලුවන් ද ඔය වරද්දපු එක?** අන්න ඒක තමයි කිවුවේ, චක්ඛායතනය වෙනයි!

“The eye is the eye, not the eye base, the eye base is the eye base, not the eye”. It has been clearly clarified in Abhi-Dhamma. Hence, can we avoid Abhi-Dhamma and get this clarified. The eye base is distinct from the eye.

දැන් ඕක තෝරා ගන්න මං විස්තරයක් කියන්නම්. ඒක තෝරාගන්නේ මහත්තයා මෙන්න මෙහෙමයි. චක්ඛු ආයතනය තෝරාගන්න ඉස්සෙල්ලා අපි මෙහෙම දකින්න ඕනේ.

To clarify this, I will first give a separate description. To understand the eye base, we have to think like this.

මේ අපේ පැරැන්නෝ කියනවා නේද මේ අපේ ශරීරයට **“ශරීර කූඩුව”** කියලා වචනයක්? මේ “ශරීර කූඩුව”, **“පංචස්කන්ධ කූඩුව**” මෙහෙම කතාවක් කියන්නේ, මේක අපි අද වෙනකන් එනවා, පැරැන්ණන් අතරේ.

Our ancestors referred to our body as a cage. Referred to it as the cage of the five aggregates.

ඔන්න ඕක හොඳ උපමාවක්! අපේ ඉස්සර ශුද්ධ – මේ අපේ තිබුණා මේ, කියන්නේ අපි ලඟ තිබුණා **“අටුවා – හෙළ අටුවා” හෙළ අටුවා වල තිබිච්චා අද නෑ! හෙළ අටුවා පත්ඉරුවක් වත් නෑ අද, ඔක්කෝම විනාස කරලා!**

This is a fine analogy. In the past we, Srilankans had our own Sinhala commentaries on Canonical texts. None of these has been spared, for us to refer today.

**පස්සේ ලියාගත්තේ බුද්ධඝෝෂාචාරීන් ගේ අටුවා මුල් කරගත්ත අටුවා තමයි දැන් තියෙන්නේ. ඒක තමයි අද ඕවා වැහිලා තියෙන්නේ.**

Nowadays we only have the commentaries composed by Buddhaghosa Thero. That is why some of the Dhamma concepts have been concealed.

අන්න, දැන් අපි දැනගන්න මෙන්න මෙහෙම දෙයක්, මේ “කූඩුව” කියන වචනය හරි වැදගත් දෙයක් මේ ආයතන පෙන්වන්න.

The cage can be a good representation to explain as to how the sense bases come into being.

ආයතන හැදුන හැටි, චක්ඛු – චක්ඛායතන නොවෙන බව පෙන්වන්න, හොඳම දෙයක්.

Fine way to show that the eye is different from the eye base.

දැන් මෙහෙම දෙයක් හිතලා බලමු, “කූඩුවක්” – අපි කඩෙන් කූඩුවක් අරන් එනවා.

Now, suppose we buy a cage.

දැන් මේක මොකද්ද අහපුහාම, එහෙනම් "කූඩුවක්!"

Now we refer to that as a cage.

මයිනෙක් දැම්මොත්, දැන් මොකද්ද අහනකොට "මයින් කූඩුවක්", මයිනා අහක් කරලා දැම්මා ගිරවෙක්, කූඩුව එහෙම්මමයි, දැන් "ගිරා කූඩුව", ඒකා අහක් කරලා දැම්මා හා පැටියෙක්, දැන් "හා කූඩුව", දැම්මා බලු පැටියෙක් – දැන් "බලු කූඩුව", කූඩුව එහෙම්මමයි!

Now if we put in a mynah, we call it a "mynah cage". We remove it and put in a parrot, now the cage still stands as it is, but now we call it a "parrot cage". Likewise, we can put in different different animals, and the cage will be renamed based on the animal inside.

**දාපු දාපු සතා අනුව ඒ කූඩුවට නමක් කිවුවා. හැබැයි, කූඩුව වෙනස් කළේ නෑ,** සතා විතරයි ඇතුලට ගත්තේ, පිටට ගත්තේ.

The cage got renamed based on the animal inside, the cage remains as it is. The only difference is the kind of animal that is kept inside.

දැන් තව එකක් ගමු කෝ, මේ ස්ථානය – දැන් ඉතින් අපි හිතමු මේක, මේ අපි ගන්නවා මේක "ගෘහයක්". දැන් පශු වෛද්‍ය වැඩපිළිවෙලක් මේකේ කරගෙන යනවා ඇවිදිල්ලා, දැන් මේක මොන ආයතනයද? පශු වෛද්‍යායතනය.

Now we'll consider this house. If some veterinarian functions his practice here, this house will be called a veterinarian clinic.

ගේ, මෙහෙමමයි! ඔහොම ටික කාලයක් ඉඳලා මේක අයින් කරලා දැම්මා, බැංකු ආයතනය – ග්‍රාමීය බැංකුවක් පිහිටෙවුවා. දැන් මේක බැංකු ආයතනය, ගේ එහෙමමයි!

The house is still a house. After sometime we tur it into a bank. Now the house, although it is the same old house, now will come to know as a banking institute.

**එහෙනම්, ආයතනය වෙනස් වුනේ ඒක ඇතුලේ කරපු වැඩපිළිවෙල නිසා මිසක්, බාහිරින් තිබිච්ච අර කූඩුව නිසා නෙමෙයි.**

The institute became different because of the change in the function within, not because of the outward frame, that is the house.

මෙන්න මේ වගේ, **"ඇහැ කූඩුවක්!" මේක "ශුන්‍ය ග්‍රාම නමුදු වේ!"** මෙසේ පෙන්වලා තියෙනවා. ඔව්, මේක කූඩුව! මේ කූඩුව තියෙනවා, මේ ගුහාව!

Likewise, the eye is a cage. It has been shown as some empty cave.

"ප්‍රසාද රූපය" මේ ඇහැත් එක්කලා සම්බන්ධයි. ජීවත් වෙලා ඉන්න කෙනාගේ චක්ඛු ප්‍රසාදයයි ඇහැයි ඔක්කෝම සම්බන්ධයක් තියෙනවා.

The translucent, sensitive matter (prasada-rupa) has a connection with the eye of a sentient being.

එතකොට, මේක කූඩුව විතරයි! දැන් මේකට බැරිවෙලා හරි **අපි කාම දෘෂ්ඨියෙන්, කාම සහගත හැඟීමකින් අපි කාමයෝ ඇසුරු කරන්න පටන්**

**ගත්තොත්, මේක කාම වස්තූන් ගේ කාම දර්ශනයන්ට ආයතනයක් කරගන්නවා.**

The eye is analogous to an empty cage. However, driven by sensuality, if we come to associate with senses, the eye will become a sense base for the vision of sensual objects.

**ඒක මේක ඇතුලේ තියෙනකන්, කාමයන්ට ආයතනයක්!** මෙන්න ආයතන හැදෙන හැටි!

Until that vision of the sensual objects remain inside, it remains a sense base. This is how the senses bases are originated.

මේ **කන තුළින් කාම හඬ අහගන්න කැමති නම්, ඒ තාක් කල් කන් දීලා අහගෙන ඉන්නවා. කන ගත්තා ඇතුලට දාන්න එකක්, කාමයන්ට අන්න ආයතනයක් කරගත්තා.** අන්න "සෝත ආයතනයක්" වෙච්ච හැටි, "චක්ඛු ආයතනයක්" වෙච්චි හැටි!

When one wants to enjoy the sensuality of sounds, he will put his ear towards the sound, giving rise to the ear base similar to the eye base.

එහෙනම්, **යම් දවසක රාගක්ෂය නම්, ද්වේෂක්ෂය නම්, මෝහක්ෂය නම්, ආයතන ඉවරයි, කූඩු ටික තියෙනවා! එහෙනම්, මේක ශරීර කූඩුව කිවුවා. අන්න ආයතන නැති වෙච්ච – සළායතන නිරෝධ වෙච්චි හැටි!**

Then one day, when the desire, anger and delusion will have been annihilated, the sense bases come to be ceased. That is why the body has been shown as a cage.

දැන් බුදුරජාණන් වහන්සේට සළායතන නිරෝධයි, කූඩුව තියෙනවා.

To a Lord Buddha, the sense bases have been ceased, but the proverbial cage remains.

එහෙනම්, පෙනීම නෙමෙයි මේ කියන්නේ! පෙනීමට බැඳුනු ඡන්ද රාගයක් ඇත්ද, ඒකෙන් තමයි මේක ඇතුලේ පවත්වන්නේ.

So we are not talking about the mere vision. If there is a sensual attachment towards such vision, then the sense bases are originated from within.

**"ඡන්ද රාගය නිරෝධ කරන්න" කිවුවා, පෙනීම නිරෝධ කරන්නේ නෑ! ඇහීම නිරෝධ කරන්නේ නෑ! ඇහෙනවා, පේනවා.**

It has been said to remove the sensual attachment, not the vision or the hearing. Things will continue to be seen and heard.

එහෙනම්, සංඛාර නිරෝධ කරන්න ඕනේ ඔතනින්. ඉතින් එතකොට සංඛාර නිරෝධ කරනකොට, අවිද්‍යා ප්‍රත්‍යයෙන් හටගන්න යම් වැඩපිළිවෙලක් ඇත්ද, ඒක නිරෝධයි!

Thus, the volitional impulses/ mental fabrications (Saṅkhāra) have to be ceased at this point. When the volitional impulses are ceased whatever activities derived from ignorance come to be ceased as well.

ඒකත් එක්ක තමයි ආයතන හැදෙන්නේ, අන්න ඡන්ද රාගය හැදෙන්නේ එතනින්.

With that only the sense bases come in to being. That's where the sensual attachment is formed.

ඉතින් කොයි තරම් සියුම් තැන් පැටලිලා ද තියෙන්නේ? ඉතින් ඒකයි කියන්නේ, **අභිධර්මයේ වැදගත් හරිය අසීමිතයි!**

See how much, these intricate points have been confused. That is why Abhi-Dhamma is so much valuable.

ඒ ටික අයින් කරලා ඉවරවෙලා මේ ධර්මය තෝරන්න ගියොත් එහෙම, පිස්සු හැදෙනවා!

අත්‍යාවශ්‍යය දේ! **අභිධර්මය නැතුව කොහොමද ධර්මය තෝරන්නේ?** නමුත්, අභිධර්මයේ හරි ගැඹුරු හරියක් තියෙනවා.

If one tries to interpret Dhamma without it, things will get pretty messed up. It is essential for the interpretation of Dhamma. But, Abhi-Dhamma does have many deeper aspects.

(ශ්‍රාවක මහතෙක්): අභිධර්මය ගත්තේ නෑ, සූත්‍ර පිටකය විතරක් අරගෙන අනිත්‍යයි අනිත්‍යයි කිවුවාට හරියන්නේ නෑ!

A listener: It will not really work to holding on to the concept of Impermanence, by referring only to the Discourses and not to Abhi-Dhamma.

(ස්වාමීන් වහන්සේ): හරියන්නේ නෑ, හරියන්නේ නෑ! මොනවාත් ගන්න බෑ! ඉතින් අභිධර්මයේ තියෙන්නේ,

Waharaka Thero: It will not, Abhi-Dhamma contains key concepts.

දැන් මෙහෙමයි, දැන් සමහර අය අහනවා **"අභිධර්මය පැමිණෙන්න ඉස්සෙල්ලා නිවන් දැක්කේ නැද්ද?" දැක්කා!**

It's like this. Some would question, before Abhi-Dhamma was established, didn't folks attain Nirvana? They did.

දැන් මෙහෙම හිතන්නකෝ, වෛද්‍ය වරයෙක් ඉන්නවා, සාමාන්‍යය වෛද්‍ය වරයාට දෙනවා – උගන්වපු විද්‍යාව අනුව "මෙන්න මේ පෙති වර්ගය මෙන්න මේ රෝගයට, මේ රෝග ලක්ෂණ පෙන්වන්නේ මෙහෙමයි" කියලා වෛද්‍ය වරයාට උගන්වනවා.

Think this way. Consider a general physician. He has been told to prescribe this particular pill to this condition. He's been taught to see the symptoms and prescribe appropriate medication.

එයාට දෙනවා පෙත්තක නමක් ගහලා, පෙත්තේ හැඩ-රුව කියලා, පෙත්ත පෙන්වලා, "මෙන්න මේ පෙත්ත තමයි මේකට දෙන්නේ" කියලා කියලා වෛද්‍ය වරයාට කියලා දෙනවා.

He's been told that this particular condition requires these pills having this name and these looks.

දැන් හොඳයි, එක සමාන වර්ණ ඇති, සමාන හැඩ ඇති, සමාන බර ඇති, යම් කිසි පෙති වර්ක කීපයක් හදලා තිබුණා නම්, එක වගේ ලෙඩ වලට, අර පැකට් එකේ ගහලා,

ඔක්කෝම කරලා, විශේෂඥ ස්ථානයෙන් හදලා එවනකොට, පෙති නිෂ්පාදනාගාරයෙන් හදලා එවනවා අර වගේ.

What will happen, if all different pills had the same colour, shape and weight? The pharmaceutical companies will manufacture the medicines, along with required details and instructions pasted on the cover.

මිනිහා ඉතින් අර ඩොක්ටර් මොකද කරන්නේ, බෝතල් වල දාලා තියාගත්තා, මොනවා මොනවායේ හරි දාලා තියාගත්තා. දැන් අර පෙත්ත බලලා, ලෙඩේ බලලා, ඒ කියන පෙත්ත බැලුවා, බලලා ඒකෙන් පෙත්තක් දුන්නා.

So the physician will check the patient's condition, look at suitable medications contained in named bottles and will give them to the patient as required.

බළලෙක් හරි මොකෙක් හරි පැනලා දඩ්-බිඩ් ගාලා මේක පෙරලුවා! දැන් පෙති ටික කළවම් වුනොත් එහෙම, දැන් දොස්තර අනාථයි!

Let's suppose some cat jumped on to the counter and messed around with bottles and the pills having the same outward looks got mixed up. The physician will be at a loss as to what pill he should give.

ඇයි? දොස්තර හැඩ රුව දකිනවා, වර්ණය දකිනවා, ප්‍රමාණය දකිනවා, මේ පෙති එක ජාතියේ දෙකක් එහෙම තිබුණා නම් මෙතන, දොස්තරට පුලුවන් ද කලවම් ඇරගන්න?

Why? The physician does see the shape, colour, weight, but since the pills are different will he be able to sort them out?

දැන් දොස්තරට පෙති වලින් බෙහෙත් දෙන්න විදිහක් නෑ, පෙත්ත වරදින්න පුලුවන්.

He cannot give medicines. Because he could be giving the wrong medicine.

දැන් ඔය වෙලාවට මොකද කරන්නේ? මේක විශේෂඥ දොස්තර ලඟට ගෙනියන්න ඕනේ මේක ඇරගන්න.

In such instances, all the pills will have to be taken back to the pharmacist.

එහෙනම්, විශේෂඥයා ලඟට ගෙනිච්චාට පස්සේ, පරියේෂණයට දාලා බලලා කිවුවහාම, රසායන පරික්ෂණය ඊට වඩා අති සියුම් එකක්. ඒකෙන් තෝරනවා, මෙන්න මේ අහවල් පෙති ටික මෙන්න මේ ටිකයි, මේ මෙන්න මේ අහවල් පෙති ටික කියන්නේ මෙන්න මේ ටිකයි කියලා තෝරලා දුන්නාට පස්සේ, අන්න දැන් ආයි සැරයක් වෛද්‍ය වරයාට පුලුවන් බෙහෙත් දීලා ලෙඩේ හොඳ කරන්න.

Then the expert will do some testing to look into the chemical composition and will sort out the different types of pills.

එහෙනම්, **පෙති සකස් කරන නිර්මාණාත්මක අවස්ථාව වගේ තමයි විශේෂඥ ධර්මය හෙවත් අභිධර්මය!**

Abhi-Dhamma is analogous to the expert knowledge going in to the chemical manufacturing of the medicines.

**ඒ වගේ, ඖෂධය වශයෙන් තියෙන්නේ ධර්මය නම්, සූත්‍ර පිටකය නම්, සූත්‍ර පිටකයේ ඖෂධය වරද්දපු දාට, බළල්ලු පැනලා අර පෙති කළවම් කළා වාගේ, අදත් ඕක වෙලා තියෙන්නේ.**

The medicines are analogous to the Dhamma, to the Discourses. Individuals have messed with the Dhamma, giving their own opinions, just like the mess created by the cat in our example.

**එක එක්කෙනා තමන් ගේ මත ලියලා. අන්න දැන් ඉතින් අපිට කළවම් වුනාට පස්සේ, ඇරගන්නේ මොකෙන්ද? අභිධර්මයටම දාලා, සුද්ධ කරලා ගන්න ඕනේ. අන්න වෙලා තියෙන එක.**

If somebody has messed with the Dhamma, giving their own opinions, then to get things back in order, we have to trace it to Abhi-Dhamma.

ඉතින්, **විභංගප්‍රකරණයේ "ආනාපාන විභංගය"** කියලා එකක් තියෙනවා. අන්න, වැදගත් ම තැනක්.

In the "Ânàpàna Vibhanga" of "Vibhangaprakaranaya" (Book of treatises on Divisions), there is one important point.

දැන් අපිට "ආනාපානය" විග්‍රහ කරන්න ගිහිල්ලා කියනවා **"ගණන, අනුපුබ්බංචන, ඵුපන, ඨපන"** ස්ථාන 4ක් ගැන කියනවා.

[(1) ගණනය, (2) අනුපුබ්බංචන, (3) ඵුපනය, (4) ඨපනය, (5) සල්ලක්ඛණය, (6) විවට්ටනය, (7) පාරිසුද්ධිය, (8) පතිපස්සනය යන මේ අට මෙනෙහි කළ යුතු පිළිවෙළ යි.]

In clarifying the "Ânàpànasati", we ae told of four stages called "counting, connection, touching, fixing".

[(1) counting (ganaṇā), (2) connection (anupubbancanā), (3) touching (ṭhupanā), (4) fixing (ṭhapanā), (5) observing (sallakkhaṇaya), (6) turning away (vivaṭṭanaya), (7) purification (pārisuddhiya), and (8) looking back on these (patipassanaya) is the order to reflect.]

ආස්වාස – ප්‍රස්වාස ගණං කරන්න කියනවා, නාගේ අග හරි තොල් පොවේ හරි හිත තියාගෙන ඉතින්, "එකයි, දෙකයි," කියලා නාසයේ ආශ්වාස – ප්‍රශ්වාස ගණං කරලා, එකේ ඉදලා පහ ට ගණිනවා.

They tell us to count the breathing ins and outs, minding the tip of the nose or the upper lip, from one to five.

පහේ ඉදලා හය, හත, අට, නමය, ඔහොම ගිහිල්ලා ගැණලා, දහයෙන් ආපහු, ආයි සැරයක් අනුලෝම – ප්‍රතිලෝම වශයෙන් යනවා. දැන් මෙහෙම කියලා දීලා තියෙනවා **"විශුද්ධි මාර්ගයේ"**, **"ගණන"** කියන්නේ හුස්ම ගණින එක.

From five to ten, then again counting in ascending and descending order. The counting has been given in the Visuddhimagga (The Path of Purification) as the counting of breathing ins and outs.

**“අනුපුබ්බංචන”** කියන්නේ එක, දෙක, තුන, හතර, පහ – එක, දෙක, තුන, හතර, පහ, හය – එක, දෙක, තුන, හතර, පහ, හය, හත කියලා දහයට වෙනකන් ගැණලා, ආපහු ගණින එක – අනුලෝම, ප්‍රතිලෝම වශයෙන් – අනුපුබ්බංචන.

The connection (anupubbancanā) has been given as counting one by one from one to ten in the ascending and descending order.

**“ඵුපන”** කියනකොට කියනවා, නාගේ අග හරි, තොල් පොටේ හරි හුස්ම වදින තැන හිත තියන් ඉන්න.

The touching (ṭhupanā) has been given as minding the tip of the nose or the upper lip, where the breath is felt.

**“ඨපන”** කියනවා එතනින් ම හිත වෙනස් කරන්න එපා, පිහිටුවාගෙන එතන ම හිත තියා ඉන්න.

The fixing (ṭhapanā) has been given as, unwaveringly keeping the mind focused on the same.

ඔන්න ගණං හතර කියලා දීලා තියෙනවා, හතර ක්‍රමයක් තියෙනවා, “ගණන, අනුපුබ්බංචන, ඵුපන, ඨපන” කියන හතර, විශුද්ධි මාර්ගයේ, ආනාපානය විග්‍රහ කරන්න ගිහිල්ලා කියලා තියෙන එක. දැන් අපි ඕක කර-කරා ඉන්නවා කියමු කෝ!

The Visuddhimagga has given these four methods as clarifications to the counting (ganaṇā), connection (anupubbancanā), touching (ṭhupanā), fixing (ṭhapanā) in explaining the Ānāpānasati meditation. Let’s say we have been following this method.

හොඳයි, ආනාපන විභංගය කියන්නේ **ත්‍රිපිටකයට අයිති, අභිධර්ම පිටකයට අයිති, විභංගප්‍රකරණයේ ආනාපාන විභංගය.** විභංගයේ තියෙන ආනාපාන විභංගය. ආනාපාන විභංගයේත් තියෙනවා **“ගණන, අනුපුබ්බංචන, ඵුපන, ඨපන”** කියන වචන හතර.

Fine. The “Ânàpàna Vibhanga” of the “Vibhangaprakaranaya” (Book of treatises on Divisions), which relates to the Discourses and the Abhi-Dhamma, also talks about the counting (ganaṇā), connection (anupubbancanā), touching (ṭhupanā), fixing (ṭhapanā).

හැබැයි, ඒකේ කොහොමද තියෙන්නේ? **“මේ ප්‍රථමධ්‍යානයයි, මේ ද්විතීයධ්‍යානයයි, මේ තෘතීයධ්‍යානයයි, මේ චතුර්ථධ්‍යානයයි”** කියලා ගණිනින් තේරුම් ගන්න – අන්න ගණන.

But how it has been clarified. “This is the First Jhàna, this is the second Jhàna, this is the third Jhàna, this is the fourth Jhàna”. This is the counting (ganaṇā).

**අනුපූර්ව ව සමවදින්න.** ප්‍රථමධ්‍යානයට සම වැදිලා, ඊලඟට ද්විතීයධ්‍යානයට, ඊලඟට තෘතීයධ්‍යානයට, ඊට පස්සේ චතුර්ථධ්‍යානයට, මේක පුරුදු කරගන්න – අනුපුබ්බංචන.

Successive attainment of Jhànas. First attain the first Jhàna, then the second Jhàna, then the third Jhàna, then the fourth Jhàna. This has to be practiced.  This is what is called the connection (anupubbancanā).

ටුපන – **පිහිටන්න එකින් එකට,** ප්‍රථමධ්‍යානය අධිෂ්ඨාන කරගන්න. ද්විතීය ධ්‍යානයයි මේ, එකින් එක පිහිට-පිහිටා යන්න.

The touching (ṭhupanā), is being able to make resolutions (adhitthāna) to touch the first Jhànas, then the second Jhànas. Likewise, to touch each Jhànas and move on to the next.

ඨපන – **ඕනේ නම්, අවශ්‍යය ඕනේ වෙලාවක් පිහිටලා ඉඳලා පුරුදු කරන්න.** ඔන්න වශීකෘත භාවය. ධ්‍යාන හතර වශී කරන හැටි මේ පෙන්වලා තියෙන්නේ.

The fixing (ṭhapanā) is to mastery of the Jhànas. Being able to stay in the Jhànas stage as long as one desire. That is what's been shown as the fixing (ṭhapanā).

**එතකොට, විභංගප්‍රකරණයේ, ත්‍රිපිටකයේ, මහ රහතන් වහන්සේලා ලිව්ව ඒ ගණන – අනුපුබ්බංචන – ටුපන – ඨපන** ඔච්චර පැහැදිලි ව පෙන්වලා තියෙද්දී,

Now while the Discourses, the "Vibhangaprakaranaya" (Book of treatises on Divisions) written by Arahants clearly given the clarifications to the counting (ganaṇā), connection (anupubbancanā), touching (ṭhupanā), fixing (ṭhapanā), …

විශුද්ධි මාර්ගයේ නාහෙන් හුස්ම ගණින්නයි, එක-දෙක-තුන-හතර-පහ කියලා ගණින්නයි, නාහේ අග හරි තොල් පොටේ හරි හුස්ම තියාගන්නයි, එතනම හිත පිහිටුවලා ඉන්නයි කියලා කියනවා.

… the Visuddhimagga talks about counting one by one, keeping the breath and the mind on the tip of the nose or the upper lip.

දැන් මොකද්ද ඉතින් යථාර්තය? දැන් ඉතින් මෙතන හොඳට, පැහැදිලි ව පේන්නේ නැද්ද අමුත්තක්?

Now what's the truth. Don't you see anything strange here.

ඔය ඔය විභංගප්‍රකරණය නොබැලූ කෙනෙක් ද ඔය විශුද්ධි මාර්ගය ලියලා තියෙන්නේ? ඒකාන්තයෙන් දැක්ක කෙනෙක් මයි! එහෙනම්, දැක්ක කෙනෙක්, මෙච්චර මේ, අපිට මේ බැලූ බැල්මට පේනවා නම් මේක මෙහෙම එකක් කොහොමද පැටලෙව්වේ, මෙතෙන්ට ගැලපුවේ කොහොමද?

Didn't the author of the Visuddhimagga ever happen to read "Vibhangaprakaranaya" (Book of treatises on Divisions). Nope, surely he may have read. Then how come something as straight forward as this was mixed up, with something different all together.

**මේ හුස්මට ඇල්ලුවේ, ඈඳුවේ මොන හේතුවෙන් ද?** එහෙනම්, මෙතන හොඳට පැහැදිලි ව පේනවා නේද, මේ නිවන් දකින්න තියෙන ආර්යය මාර්ගයේ ආනාපාන සතිය පැටලෙන්න මේ ගොතලා තියෙන හැටි! වෙනස් කරලා තියෙන හැටි! හොඳට පැහැදිලියි නේ!

Why was it ever connected with the breath? See, the extent of scheming very much clear, with the ulterior motive of hindering the Ânàpànasathi meditation of the Noble path. See how it has been turned into something totally different.

**“බුදු – පසේ බුදු – මහ රහත් වැනි මහා ප්‍රාඥයින්ට ආනාපාන සතිය සප්‍රාය වේ, මෝහ චරිතයාට ආනාපානයක් නොකියමි!”**

“Ânàpànasathi meditation is comprehensible to profoundly wise men such as Sammâ-Sambuddhas (perfectly enlightened ones), Paccekabuddhas ("a lone Buddha", "a Buddha on their own", "a private Buddha", or "a silent Buddha") or Arahants. It is not meant for unwise men.”

බුදු රජාණන් වහන්සේ මජ්ජිම නිකායේ දේශනා කරලාත් තියෙනවා.

In the Majjhima Nikāya ("Collection of Middle-length Discourses"), the Lord Buddha has uttered these words.

විශුද්ධි මාර්ගයේ කියනවා **“ආනාපාන සතිය මෝහ චරිතයාට සප්‍රාය වේ!” දැන් කෝ ගැලපීම?**

Visuddhimagga says that the Ânàpànasathi meditation is comprehensible to unwise men. Where is the consistency.

ඉතින් කොහෙද හරියන්නේ ඉතින්? ධර්මයට ගැලපිලා කෝ? අන්න, විශුද්ධි මාර්ගයේ එහෙම කියනවා, බුදු රජාණන් වහන්සේ ගේ ආනාපාන සතිය මොකද්ද? ඒක දකින්නේ නෑ!

So how will it work? It cannot be traced to the Dhamma. Visuddhimagga says one thing, the Lord Buddha says another. Why has this not been seen?

(ශ්‍රාවක මහතෙක්): ඉතින් ස්වාමීන් වහන්ස, අපේ අයට වැරදිලා තියෙන්නේ, **සිවු පිළිසිඹියා පත් අරිහතුන් වහන්සේලා ලියපු එක කියවන්නේ නෑ,** අර අහක යන, සාමාන්‍යය…

A listener: The folks have got it all wrong, referring to the work of an ordinary monk, ignoring the those of Arahants with the knowledge of four discriminations.

(ස්වාමීන් වහන්සේ): **සිවු පිළිසිඹියා පත් අරිහතුන් වහන්සේලා ගේ බණ – අභිධර්මය පස්සෙ හදාගත්ත එකක් කියලා දානවා පැත්තකට.**

Abhidamma has been put aside saying that it came much later and it’s just the work of Arahants with the knowledge of four discriminations.

**අර විශුද්ධි මාර්ගයේ අරකයි – මේකයි කියන එක මුදුන් මල් කඩක් කියලා දරා ගන්නවා,** ඒක හරි එකක්! දැන් කොතන ද ඉන්නේ? ඉතින් කාට කියන්නද මේවා?

But the Visuddhimagga is being treated as the Holy Grail. To whom we should say this.

(ශ්‍රාවක මහතෙක්): එතකොට, බුද්ධඝෝෂ හාමුදුරුවෝ සම්මා දිට්ඨිය – සෝවාන් ඵලයක් වත් නෑ නේද?

A listener: Buddhaghosa Thero hadn’t even attained the stage of stream enterer. Had he?

දැන් බුද්ධඝෝෂ හාමුදුරුවෝ කියන්නේ දැන්, ඕං අපි නුවණින් නැති, **අඩු ගානේ මේ අපේ ඉතිහාස කතාව වත් බැලුවා නම්, වැදගත් දෙයක් දකින්න පුලුවන්.**

Now, had we even looked in to the historical story with our common sense, we should've been able to see something important.

ඔය මහා විහාරයට ඇවිදිල්ලා ථේරවාදී පරපුරත් එක්ක සම්බන්ධ වුනායි කියලා අපි හිතාගෙන ඉන්නවා බුද්ධඝෝෂ හාමුදුරුවෝ ගැන.

We are of the view that the Buddhaghosa Thero had links with the Maha Vihāra (the Great Monastery) and its Theravāda lineage.

**ථේරවාදී පරපුරත් එක්ක මහා විහාරයේ සම්බන්ධය තිබුණේ මහා විහාරය ගිණිබත් කරනකන් විතරයි,** මුලදී.

Theravāda lineage and the Maha Vihāra were connected only until such time that the Maha Vihāra got burnt to the ground.

මහා විහාරය ගිණිබත් කරනකොට සම්පූර්ණ ම මහා විහාරයේ හිටපු භික්ෂූන් වහන්සේලා, ථේරවාදී පරපුර, දාලා යන්න ගියා ඔක්කෝම!

When the Maha Vihāra was burning, all the monks from Theravāda lineage had to flee.

දින 7ක් පොත් ගුල් ගිණිගත්තා කියලා මහාවංශයේ විග්‍රහ වෙනවා, මහා විහාරයේ තිබිච්ච පොත්-පත්.

The Mahavamsa ("Great Chronicle") claims that the libraries in the Maha Vihāra was burning for seven days.

එහෙනම් එතකොට, **පොත් ගුල් ගිණිගන්න දින 7ක් තිස්සේ, ත්‍රිපිටකග්‍රන්ථාරූඪ කරන්න ඉස්සෙල්ලා තිබිලා නැද්ද අපේ පොත්–පත්? මොනවාද ගිණි ගත්තේ?**

If it took seven days to burn up all those texts, didn't we have any Buddhist scriptures, before the Tipiṭaka, the canonical text is claimed to have been committed to writing.

එහෙනම්, ඊට පස්සේ ඔය වෙලාව වෙනකොට අභයගිරිය විහාරයයි, මහා විහාරයයි දෙකේ භේදයක් නිසයි ඔය ප්‍රශ්නය මතු වුනේ.

This unfortunate incident arose because of some feud between the Maha Vihāra and the Abhayagiri Vihāra (Abhayagiri Monastery).

ඊට පස්සේ මේ මහා විහාරය ගිණිබත් කරපුහාම, අභයගිරි වාසීන් රාජ පාක්ෂිකයි, ආයේ තනතුරු දරාගෙන, රාජ ඨානාන්තර දරාගෙන, මිනිස්සුන් ගේ හිත් දිනාගන්න ක්‍රම හදාගෙන හිටපු පිරිසක්.

The monks residing in Abhayagiri Vihāra, were loyal to the Kings of that time, took on designations in the governing, were trying to win over the general public.

ඔය පිරිසෙනුත් කොටසක් භේද වෙලා **"දක්ෂිණගිරි"** කියන විහාරයකට ගියා.

From there another faction of monks departed as a result of another feud and came to reside in the Dhakshinagiri Vihāra (Dhakshinagiri Monastery).

ඒ නිසා, **"සාගලික" කියන භික්ෂුවක් දක්ෂිණගිරි කියන විහාරයේ පදිංචි වෙලා,** එතන හදාගත්තා තමන්ගේ ගෝල පිරිසක්.

There lived a monk called “Sagalika” with a lineage of student monks.

අර මහා විහාරය ගිණිබත් කරපුහාම බෞද්ධයින් ගේ ඇති වෙච්ච කෝප – කැරැල්ලක් ඇති වුනා, කෝප වෙලා බෞද්ධයෝ.

The burning down of Maha Vihāra instigated riots amongst Buddhists.

රජ්ජුරුවෝ ඒකට බය වෙලා, රජ්ජුරුවෝ පොරොන්දු වුනා, මහා විහාරය තිබුණ හැටියටම හදලා දෙනවා කියලා.

The King got alarmed and promised to reinstate the Maha Vihāra.

ඔතන “උඳු” වැපුරුවා කියලා තියෙනවා බිම, හාලා! මොකද, මහා විහාරය විනාශ කරලා ඉස්සෙල්ලා.

It is said that black gram had been cultivated where the Maha Vihāra was standing.

**එතන තිබ්ච්ච හැටියට හදලා, බාර දුන්නේ කාටද? අර “දක්ෂිණගිරි” විහාරයට ගිය අර “සාගලික” පරම්පරාවට!**

The Maha Vihāra got restored, but was handed over to the lineage of monks coming from that “Sagalika” Thero.

දැන් ඊට පස්සේ මහා විහාරය, අලුත් මහා විහාරයේ කවුද ඉන්නේ? අභයගිරියෙන් භේද වෙලා දක්ෂිණගිරි විහාරයට ගිහිල්ලා, ඒකෙන් ආපු කොටස මහා විහාරයේ දැන් ඉන්නේ!

Then in Maha Vihāra resided those monks from Dhakshinagiri Vihāra, who left Abhayagiri Vihāra due to some clash.

**දැන් මහා විහාරයේ භික්ෂූන් කියන – අන්න එතෙන්ට තමයි ආවේ බුද්ධඝෝෂ හාමුදුරුවෝ! එහෙනම්, බුද්ධඝෝෂ හාමුදුරුවෝ ඇවිදිල්ලා තියෙන්නේ ථේරවාදී පරපුරක් ලඟට ද? ඉතින්, ඔතෙනදී කොහොමද ඇත්තක් ලියවෙන්නේ?**

That was when Buddhaghosa Thero came to Maha Vihāra. He never came into contact with monks from Theravāda lineage. How could something truthful have emerged from there?

ඒගොල්ලන්ට ඕනෑ කම තියෙන්නේ ලාභ – කීර්ති – ප්‍රශංසා ලබාගෙන, ආර්ය මර්ගය පිරිහෝලා දාලා, මිනිස්සු අතර නම තියාගෙන, තමන්ගේ වැඩේ කරගන්න. ඉතින් ඕකනේ වෙලා තියෙන්නේ!

The then residents of Maha Vihāra, were after personal benefits, publicity and praise. They had already setback the Noble path, were pursuing personal agendas to build up their names.

ඉතින් කොහොමද ඔය අටුවාවේ ප්‍රශ්නය, කොහොමද අපි හරියට ගන්නේ? අටුවාවේ කොහොමද විග්‍රහ වෙලා තියෙන්නේ?

So how can we get this issue of the commentaries sorted out? What has been clarified in the commentaries.

**ඉතින් පෙළ දහම හරි! මොකද? මාතලේ අළු විහාරයට ආදිය ගිහිල්ලා උන්වහන්සේලා, ගිහිල්ලා, හැම තැනම ත්‍රිපිටක පොත් ලියලා, තිබ්බා හංගලා!**

The Pali Canon is correct. Monks of those days, went to places like Alulena in Maathalé, committed the Canon in to writing and kept them hidden everywhere.

ත්‍රිපිටක තිබ්බ නිසා ත්‍රිපිටක හැඟවුනා – හැඟවිලා, මතු වෙලා ආවා ත්‍රිපිටක වාක්‍ය ටික.

Since the Pali Canon was there, although hidden, when the time was right, it came out alright.

අටුවා ලියන්න ගියාට පස්සේ, තමන්ට ඕනේ අටුවා ලිවුවා. ඉතින් ඊට පස්සේ අටුවාවෙන් අපිට හොයා ගන්න බෑ දැන් ත්‍රිපිටකයේ අර්ථය මොකද්ද? අර්ථය වැහුණා!

When the commentaries were written, they were done as preferred. The meanings got distorted. Now we can’t sort out the canonical meanings properly.

(ශ්‍රාවක මහතෙක්): ඒක වුනේ ස්වාමීන් වහන්ස, අර සිවුපිළිසිඹියාපත නැති වුනු හින්දා,

A listener: That happened due to the loss of knowledge of four discriminations, right?

(ස්වාමීන් වහන්සේ): අන්න ඒකයි කියන්නේ, ඒ හිටියා නම් මේ පෙළ දහම හොඳටම ඇති!

Waharaka Thero: That is why, if such individuals were there, the Pali Canon would be more than enough.

(ශ්‍රාවක මහතෙක්): රහතන් වහන්සේලා ලියපු එකක් අර්ථ නිරුක්ති වලින් ගන්න බෑ! අර්ථ නිරුක්ති නැති කම නේ?

A listener: Now since the knowledge of linguistic expression got lost, it was difficult to decipher the work of Arahants.

(ස්වාමීන් වහන්සේ): අන්න ඔව්, ගන්න බෑනේ! ඒකයි. ඉතින් **අර්ථ – ධර්ම – නිරුක්ති – පටිභාන තියෙනවා, නැඟුනා නම්, අර ධර්මය බලනකොට ලස්සනට පේන්න පටන් ගන්නවා, මෙන්න නියම දහම් මාර්ගය! මෙන්න වරද්දලා තියෙන එක!** මේකේ හේතුව මෙන්න! ඔය දෙකම කීයහැකි!

Waharaka Thero: Exactly, you can’t. Thus, if one has the discrimination of meaning (artha), discrimination of phenomena (dharma), discrimination of linguistic expression (nirukthi) and discrimination of exposition (patibhāna), when you see the Pali Canon, you will easily know the path of Dhamma. You will know what has been falsified. And this why? Both can be identified.

මෙන්න මේ හේතුවෙන් මේක වැරදියි! මේ හේතුවෙන් මේක හරි! විග්‍රහ කරන්න පුලුවන්.

Because of this, this is correct, and because of this, this is wrong. Can be clarified.

දැන් ඉතින්, ඔය ටික පෙන්වනකොට, **“චත්තාරෝ අස්සසාසෝ අධිගතෝ හෝති!”** කියලා, **සතර ආශ්වාසයක් ලබනවා** කියලා පෙන්වලා තියෙනවා අපි දන්න, ඔය හැමෝම දන්න **කාලාම සූත්‍රයේ** අගට තියෙනවා

Towards the end of Kālāma Sutta, it has been said that "one who is a disciple of the noble ones, acquires four assurances (Assāsa)".

**"වෛර පහක්, භය පහක් දුරු කළ ආර්ය ශ්‍රාවකයා ඉහාත්මයේ ම ආශ්වාස 4ක් ලබයි"-** "චත්තාරෝ අස්සසාසෝ අධිගතෝ හෝති"

"Now, Kalamas, one who is a disciple of the noble ones — his mind thus free from hostility, free from ill will, undefiled, and pure — acquires four assurances in the here-and-now:

අන්න, "අස්සසාස" කියන වචනය පැහැදිලිව තියෙන තැනක්.

There we have a place which clarifies the word "Assāsa". It means assurance.

**"සතෝව අස්සසති" – සිහියෙන් හුස්ම ගන්න නෙමෙයි කිවුවේ,** අන්න ආශ්වාසය ගන්න කිවුවේ අන්න එතන තියෙනවා අස්සාසය.

"Sathowa assasathi". It doesn't mean to breath mindfully. It says to obtain the "Assāsa" or assurance. There we have the assurance, something reassuring.

මොකද්ද? **"අස්වැසිලි 4ක් ලබනවා"** – සැනසීම් 4ක් ලබනවා.

There will be four types of assurances available to a disciple of the noble ones.

මොකද, යථාර්තය දැනගත්ත ඒ ආර්ය ශ්‍රාවකයා, ඒ තමන් විසින් මේ එතෙන්ට පත් වෙනකොට, එයා පාපය අත්හැරිලා යනවා එයාගේ. මොකක් නිසාද?

Because, while becoming a disciple of the noble ones, he will abandon ill deeds.

**මේ ලෝකයාට වෛරය ඇති කරන, භය ඇති කරන, මේ යම් පංච දුස්චරිතයක් එයාගෙන් කෙරෙන්නේ නැතුව යනවා.**

He isn't going to commit the five sins, which give the worldly beings hostility, and ill will.

එතකොට, අන්න ඒ වෙලාවෙදී මොකද වෙන්නේ? ඔන්න ඔය කියන මේ මේ – නැති වෙලා යන්නේ, **කාගෙවත් දෘෂ්ඨි වලට අහු වෙලා නෙමෙයි,** කවුරුවත් කියන පද අහලා නෙමෙයි. වරද – වරද හැටියට දැකලා, දුස්චරිතය – දුස්චරිතය හැටියට, නොකටයුත්තක් හැටියට දැකලා යි පහ කර දමන්නේ – ධර්මාවබෝධයේදී!

He does this not based on any false view. He sees wrongs doings for what they are and comes to realise that those should not be carried out, through the understanding of Dhamma.

ඒකාලේ එක එක මත තියෙනවා. එක එක අය – අන්‍ය පරිබ්‍රාජකයෝ ඇවිල්ලා එක එක දේශනා කරලා යනවා.

Those days there had been many different views. Other religious men, came and preached all sorts of everything.

පෙළක් අය ඇවිදිල්ලා කියනවා "යම්කිසි කෙනෙක් කරන්නා" – මෙහෙම, කියන්නේ "**පරලොවක් තියෙනවා, කරන ලද පිං–පවු වල විපාක පල දෙනවා**" දැන් ඔය එක

කට්ටියක් ඉතින් මෙහෙම දේශනා කරනවා. "ඒ නිසා පවු කරන්න එහෙම එපා!" එහෙමත් කියනවා.

Some said that there is a world after death, if there is the fruit of actions rightly and wrongly done and one should refrain from doing wrong actions.

දැන් ඒගොල්ලන් ගේ බණ අහලා මේ **සෝවාන් පුද්ගලයා, නැත්නම් මේ ආර්යය ශ්‍රාවකයාට ඒගොල්ලන් ගේ බණ අහලා පවු නොකර ඉන්න ඕනේ කමක් නෑ!**

Now there is no need for a stream enterer to hear such words and to refrain from sinning.

මොකද, "මං **වරද – වරද හැටියට දැකලා**, දුස්චරිතය – දුස්චරිතය හැටියට දැකලා, මං මේක අත්හැරලා ඉන්නේ! මට පරලොවක් තිබුණොත් එකයි, නැතත් එකයි! – පිං පවු තිබුණත් එකයි, නැතත් එකයි! මං ඒ නිසා මට මේ අත්හරින්න ඕනේ කමක් නෑ, ඔයාලාගේ කීම අහලා."

A stream enterer would say "It doesn't matter whether there is a world after death or not, whether there is, or there is no fruit of actions rightly and wrongly done, I am renouncing wrong actions, simply because they are wrong."

(ශ්‍රාවක මහතෙක්): **සහාවස්ස දස්සන සම්පදාය!**

A listener: "With his gaining of insight he abandons three states of mind, namely self-illusion, doubt, and indulgence in meaningless rites and rituals, should there be any."

(ස්වාමීන් වහන්සේ): අන්න, එතන ලබලා තියෙනවා. පෙලක් අය කියනවා, "**පරලොවකුත් නෑ, කරන ලද පිං–පවු වල විපාකයකුත් නෑ!**"

Waharaka Thero: Yes, that insight has been attained. Some other preachers said that, "there is no world after death, and there is no fruit of actions rightly and wrongly done"

– "ඉතින් මගේ මොකද? මං පවු නොකර ඉන්නේ පරලොවක් නැති හින්දා වත්, පිං-පවු වලට විපාක නැති හින්දා වත් නෙමෙයි, මේවා වැරදි බව මට පේන හින්දා, මේවා දුස්චරිත බව පේන හින්දා, නොකටයුතු බව පේන හින්දා, අවැඩ බව පේන හින්දා" අන්න දෙවෙනි ආස්වාසයත් ලබනවා.

"So what? I am renouncing wrong actions, simply because they are wrong, not because there is no world after death, or there is no fruit of actions rightly and wrongly done." This is the second assurance that he acquires.

"**කරන්නා ටයි මේ පවු සිද්ද වෙන්නේ**" කියලා තව කට්ටියක් කියනවා,

Some others said, "Evil is done through acting; thus the evil doer is the sinner"

පවු කරපු කෙනාට පවු! "ඉතින් මගේ මොකද?, කොහොමත් මට – පවු කරන කෙනාට පවු වුනත්, පවු නොකරන කෙනාට පවු වුනත් මට ප්‍රශ්නයක් නෑ! මං එහෙම නිසා පවු නොකර ඉන්නවා නෙමෙයි! ඉතින් දැන් ඔගොල්ලන්ගේ බණ මට අහලා අමුතුවෙන් දරා ගන්න එකක් නෑ!" අන්න තුන්වෙනි ආස්වාසයත් ලබනවා.

“So what? I am anyway renouncing wrong actions; it doesn't matter if the evil doer is a sinner or not. I have nothing new to bear from your teachings.” This is the third assurance that he acquires.

**“කරන්නා ට පවු සිදු නොවේ නම්”** –

Some others said, “No evil is done through acting; thus the evil doer is not the sinner”

“ඉතින් මගේ මොකද? මං මෙලොවත්, පරලොවත් සැනසිල්ලේ ඉන්නවා නේ! මොකද, මං ඒ නිසා වත්, පවු සිද්ද වෙන්නේ නැති හිංදා මං පවු නොකර ඉන්නවා නෙමෙයි, එහෙම ප්‍රශ්නයක් නෑ! මේක වරද-වරද හැටියට මට පේනවා.” මෙන්න **මේ ආකාරයෙන් ආස්වාස 4ක් ලබනවා මෙලොවදීම** කියලා පෙනවනවා.

“So what? I am anyway renouncing wrong actions, simply because they are wrong; it doesn't matter if the evil doer is not a sinner or is.” This is the fourth assurance that he acquires in the here-and-now.

**මෙන්න ආස්වාස! මෙන්න “චත්තාරෝ අස්සසාසෝ අධිගතෝ හෝති!”** මෙන්න අධිගත කරන එක!

These are the assurances. "acquires four assurances”. These are what's acquired.

අස්සසාස – “ආස්සාස සූත්‍රය” කියලා සූත්‍රයක් තියෙනවා. **“අස්සාස සූත්‍රය” සහ “පරම අස්සාස සූත්‍රය”**

There is a discourse called Assāsa Sutta. Assāsa Sutta and Param'Assāsa Sutta

**ස්පර්ශ ආයතන 6 පිළිබඳ “උදයංගම – අත්ථංගම – ආස්වාද – ආදීනව – නිස්සරණ තතු සේ දකීද, එකල්හි ආස්වාසයෝ පූර්ණ ය!”**

“If a monk, while factually keeping track of
udayaṃgama (rising), atthangama (continuance/ growth),
assāda (optimum), ādinava (decay starts), and nissarana (last stage leading to passing away) with regard to the sense-faculties, what has to be drawn in (assurances) are fulfilled.”

මෙන්න, පූර්ණය කරන ආස්වාසයක් මේ සාසනයේ තියෙන්නේ, අරගෙන – අරගෙන පහ කරන එකක් නෙමෙයි! අරගන්න එකක් නෙමෙයි, අරගෙන පහ කරන එකක් නෙමෙයි – පූර්ණ කරන එකක්.

In this dispensation, the assurance is not something that is taken in and then let out. It is something that is fulfilled.

චක්ඛු ස්පර්ශ ආයතනය – චක්ඛු සංස්පර්ශ ආයතනය, සෝත සංස්පර්ශ ආයතනය, ඝාන සංස්පර්ශ ආයතනය, ජිව්හා සංස්පර්ශ ආයතනය, කාය සංස්පර්ශ ආයතනය, මනෝ සංස්පර්ශායතනය. මෙන්න මේ හය පිළිබඳව, උදයංගම – අත්ථංගම – ආස්වාද – ආදීනව – නිස්සරණ තතු සේ දකීද, එකල් හි ආස්වාසයෝ පූර්ණය වේ!

“If a monk, while factually keeping track of
udayaṃgama (rising), atthangama (continuance/ growth),
assāda (optimum), ādinava (decay starts), and nissarana (last stage leading to

passing away) with regard to the eye sense-base, ear sense -base, nose sense-base, nose sense-base, tongue sense -base, body sense -base, mind sense –base, what has to be drawn in (assurances) are fulfilled."

මෙන්න **පූර්ණ කරන ආස්වාසය** තියෙන තැනක්, මෙන්න **"සතෝව අස්සසති!" සිහියෙන් අරගන්න** කිවුව එක.

This is a place where what needs to be drawn in, what assurances need to be fulfilled has been clarified. This is what needs to be drawn in mindfully (satova assasati).

මොනවාද පූර්ණ කරගන්න ආස්වාස? අන්න, චක්ඛු සංස්ඵර්ශය අපි දකින්න ඕනේ. මේ ඇහෙන් ගන්න ස්ඵර්ශයක් තියෙනවා, සංස්ඵර්ශයක් තියෙනවා.

What are the assurances that need to be fulfilled? One has to see the affiliating contact of the eye. There is a contact that is taken from the eye, additionally there is also an affiliating contact.

**ස්ඵර්ශ – සංස්ඵර්ශයක් වෙන්නේ මොකක් නිසාද?**

What makes a contact (passa), an affiliating contact (sampassa)?

**ස්ඵර්ශ කරලා නතර කරන්න බෑ, සංස්ඵර්ශ කියන්නේ ඒකත් එක්ක අපි එකතු වෙනවා. මොකක් නිසාද? අවිද්‍යා – තෘෂ්ණාව නිසා! අන්න, ආයතනයක් හැදෙන හැටි!**

Mere contact is not enough, need to be affiliated with the sense object. Why? Because of ignorance and desire. See that is how sense-bases come to be.

සෝත සංස්ඵර්ශය, ඝාන සංස්ඵර්ශය, මේවා හැදෙන්නේ එහෙම.

Affiliating contact of eye, affiliating contact of ear, that is how they to come to be.

අවිද්‍යාවත් – තෘෂ්ණාවත් එක්ක එකතු වෙලා, අර කියන්නේ – දෘෂ්ඨියෙන් අරගත්තාට පස්සේ, **"ආත්ම දෘෂ්ඨියෙන්" ගත්තාට පස්සේ, අපිට සං–ස්ඵර්ශ ගොඩනැඟෙනවා.**

When affiliated with ignorance and desires, perceived as worthy of holding on to, the affiliating contact becomes.

මෙන්න මේ ආයතන 6 පිළිබඳව "උදයංගමය" දකින්න ඕනේ, "අත්ථංගමය" දකින්න – දැන් ඕකට "අස්ථංගම" කියලා අද තෝරන්න යනවා, හටගැනීම – විනාසය කියලා.

We have to see this rising (udayaṃgama) of the six sense bases. Nowadays, this has been clarified as the rising and collapsing.

"උදයංගමය" කියන්නේ උදා වෙන හැටි. "අත්ථංගමය" කියන්නේ උදා වෙච්චි එක පැවැත්ම පේන හැටි. "ආස්වාද" කියන්නේ ඒකෙන් ලබන ආස්වාදය.

Udayaṃgama means the rising. Atthangama means how the continuance is manifested, assāda is optimum state where is it is entertained.

"ආදීනව" කියන්නේ ඒකේ අන්තිමට ලැබෙන, වැහැරී යන ආකාරයෙන් ආදීනව දකින්න ඕනේ.

Ādinava means the starting of the decay, from how the decaying progresses, one needs to see the bad consequences.

ඊලඟට "නෙක්ඛම්ම – නෙක්ඛම්ම" එතකොට, ඒක ඉවර වෙන හැටි. කටයුතු ක්‍රියා කරලා ඉවරයි.

Then nissarana is the last stage leading to passing away. It is no more.

මේ සියළුම දේකට, ඇහැ – කන – දිව – නාසය – ශරීරය කියන මේවාටත්, ඒ වාගෙම, රූප – ශබ්ද – ගන්ධ – රස – ඵොට්ටබ්බ – ධර්ම කියන මේවාටත්,

To everything, to the eye-ear-tongue-nose-body, as well as to visual objects-sounds-odors-falvours-touches-mental objects.

උදයංගම – අත්ථංගම – ආස්වාද – ආදීනව – නිස්සරණ කියන ක්‍රියා කලාප, ක්‍රියා පිණ්ඩනයක් තුළ – සම්පිණ්ඩයක් තුළ, සිද්ද වෙන ක්‍රියා දාම තමයි මේ ලෝකේ හැම දෙයක්ම!

All worldly things are the manifestation of the recurring process of arising, continuance, optimum, decaying and passing away, over and over again.

ඇහැ – කන – දිව – නාසය – ශරීරය බැලුවත්, රූප – ශබ්ද – ගන්ධ – රස – ස්ඵර්ශ ගැන බැලුවත්, අභ්‍යන්තර – බාහිර කොහේ බැලුවත්, යමක් නිර්මාණය වෙන්නේ උදයංගමයෙන්,

Let it be the eye-ear-tongue-nose-body, internal or external, all phenomena are manifested from arising.

උදා වුනා! උදා වෙච්චි එක, උදා වෙන මට්ටමක් තියෙනවා. ඒ මට්ටමට ආවා – අත්ථංගමයට ආවා. ඊට පස්සේ, ඒක ආස්වාද දෙන කාලයක් ආවා. ඊට පස්සේ, ඒ කාලය ගෙවී ගියා – ආදීනව කාලෙට ආවා. ඊට පස්සේ වැනසිලා ගියා.

Arose. There is a threshold to the arising, once there, it's arisen. Then it continues and comes to the optimum stage and then it stats decaying, and with the passing of time, it passes away.

**මෙන්න මේ ක්‍රියාවලිය යි මේ ලෝකේ තියෙන්නේ කියලා හරියට දැක්ක දාට, ආස්වාස පූර්ණයි!**

This recurring process to all worldly phenomena, when seen factually, what needs to be drawn in (assurances) will have been fulfilled.

**ඇසුරු කළ යුත්ත ඔච්චරයි ඇසුරු කරන්නේ, දහම් ඇසුරු කරනවා ඔතෙන්ට එන්න.**

This is what need to be associated with. One associates Dhamma to come thus far.

දැන් ඉතින් බලනවා, කොහොමද ඒක? **උදයංගම** – ළමයෙක් පිළිසිඳගත්තා, නැත්නම් බඩට ආවා. එතන පටන් ගෙන ළමයා වැඩෙන්න පටන් ගත්තා – උදයංගම වුනා!

Now we'll reflect on this. Arising – a baby is conceived. From there on starts to grow.

දැන් ළමයා බිහි වුනා. බිහි වුනාට පස්සේ අවුරුදි 16ක් විතර වෙනකන් ළමයා උදයංගම අවස්ථාවේ, නැඟිලා එනවා.

The child is born. Until the age of 16, the child is in the stage of arising.

නැඟිලා එන්නේ, අවුරුදු 16ක් 17ක් ගියාට පස්සේ මෝරනවා මිසක්, උස යන්නේ නෑ – මහත ඒ වෙන එක, මෝරනවා තියෙන ඇඟ. ඇඟ වැඩිලා ඉවරයි. අන්න, **අත්ථංගමයට** ආවා.

Grows up, after the age of 16 or 17, the growth will be sideways not upwards. The body has been grown. It's in the stage of continuance or growth.

දැන් ඉතින් **ආස්වාද** – තරුණයා, තරුණිය. ආස්වාද හොයාගෙන යනවා, ආස්වාද කාලේ.

Now in the optimum stage, the teen starts pursuing pleasures.

ඒ අවස්ථාව ඉක්ම ගියා, මැදි වයසට ආවා, **ආදීනව** කාලෙට ආවා, මැරිලා ගියා – **නෙක්ඛම්ම**!

After that, comes to the middle age, comes to the stage of decay. Then dies, the stage of passing away.

ඔය අතර කාලයක් තුළ තමයි – උපතයි මරණයයි අතර ක්‍රියා සිද්ධාන්තය යන්නේ, **උදයංගම – අත්ථංගම – ආස්වාද – ආදීනව – නිස්සරණ!**

Between the birth and death, the process of arising, continuance (growth), optimum, decaying and passing away takes place.

**ඕකෙන් අහක් වෙලා පැනපු තැනක් කිසිම සත්ත්වයෙකුට නෑ!**

No sentient being escapes this phenomenon.

ගහක් හිටවනවා. අඹ ඇටයක් හිටෙවුවා – උදයංගම. පැල වෙලා ආවා, ඉතින් ගහ වැඩිලා එනවා එක්තරා මට්ටමක් තියෙනවා, අඹ ගහක් ලොකු වෙන මට්ටමක්. ඔයිට වඩා ලොකු වෙන්න බෑ, මෝරනවා මිසක්. අත්ථංගමයට ආවා.

One plants a mango seed. Arising. It sprouts, grows up to some height, after that it will grow sideways. That is the continuance/ growth.

ඉතින්, එල දරනවා – හොඳ අඹ ගහ, ඇඹුල් අඹ ගහ කියනවා, එල දරනවා – ආස්වාද කාලේ. ඊට පස්සේ අඹ ගහ මෝරලා, මෝරලා ගිහිල්ලා, දැන් කොලත් හීං වෙලා, අතුත් කැඩිලා ගිහිල්ලා, ආදීනව කාලේ. ගහ මැරිලා ගියා – නිස්සරණ!

Then the tree bears fruits, sweet or sour. This is the optimum stage. Then with time the leaves become slender, the branches start to fall off, the stage of decay. Then the tree dies, the passing away.

**අඹ ගහටත් එච්චරයි, කජු ගහටත් එච්චරයි, කොස් ගහට – පොල් ගහටත් එච්චරයි, මේ ලෝකේ ද්‍රව්‍ය – වස්තූන්ටත් එච්චරයි, අපිටත් එච්චරයි!**

The same actuality befalls the mango tree, or the cashew tree, the jack tree, the coconut tree, whatever. All the material objects of the world, even us. Subjected to the same actuality.

එහෙනම්, හටගත්ත හැම දෙයක් ම උදයංගම – අත්ථංගම – ආස්වාද – ආදීනව – නිස්සරණ කියන මෙන්න මේ ක්‍රියාදාමය තුළ ගංගා ප්‍රවාහයක් නොනවත්වා ගලා යනවා වාගේ ගිහිල්ලා වැනසිලා යනවා!

Whatever arising, is subject to the process of arising, continuance, optimum, decaying and passing away, flowing continuously, over and over again like a river.

ඕක නවත්වන්න කෙනෙක් නෑ, ඕක ධර්මතාවය!

No one can stop it, it is the norm, the actuality, the law and order of things.

ඔන්න, **ධර්මතාවය – ධර්මතාවය හැටියට දැක්කා නම්, එතකොට අන්න එදාට මොකද කරන්නේ? ආස්වාසයක් කරගත්තා, ඇත්ත ආස්වාස කළා! අස්වැසිල්ල ලැබෙනවා.**

When you see the actuality for yourself, what will be done next?

What needs to associated (assurances) has been drawn in, associated with. Assured.

**එහෙනම්, ඕක ඔහොම නම්, ඕකේ "මම" කිවුවාට, "මගේ" කිවුවාට, "මගේ ආත්මය" කිවුවට පුලුවන් ද තියා ගන්න? කෝකද හිර කරන්නේ? "මම" කියලා ගන්නේ මොකද්ද? "මගේ" කියන්නේ මොනවාද? මගේ වචනයක් විතරයි ඒක!**

Then is anything worthy of owning, to call it me, mine, myself. Whatever we call it, can we keep it the way I like. What to call mine. Mine is merely a hollow word, isn't?

කිවුවාට සිද්ද වෙනවාද? මම බලාපොරොත්තු වුනාට, ඒක හරියන්නේ නෑ, උදයංගම – අත්ථංගම – ආස්වාද – ආදීනව – නිස්සරණ! ඒ ක්‍රියාවලියක යනවා ඒ තුළ, ඊලඟ වැනසිලා යනවා.

Just because if hope for will it work? Nope. Merely in flows through and perishes a continuum of arising, continuance (growth), optimum, decaying and passing away.

ඕක "මම" කිවුවත් නවතින්නේ නෑ, "මගේ" කිවුවත් නවතින්නේ නෑ, "මහ රජ්ජුරුවොන් ගේ" කිවුවත් නවතින්නේ නෑ, "දෙයියන් ගේ, බ්‍රහ්මයන් ගේ" කිවුවත් නවතින්නේ නෑ, නවත්වන්න බෑ! ඔය ධර්මතාවය ඔච්චරයි.

Although we call it, me, mine, it will not stop. You can call it the king's, the god's, the Brahma's. No way, it will stop, can't be stopped. That is the norm, the actuality.

**එහෙනම්, ඕක නම් ධර්මතාවය, ඕක දැක්ක ගමන් ආස්වාසය පූර්ණයි! ඕක තමයි දැකගන්න ඕනේ. අන්න, දහම් ආස්වාසය – හුළඟ නෙමෙයි!** ඉතින්, මෙච්චර පැහැදිලි ව පෙන්වලා තියෙද්දී සූත්‍ර වල, හුළඟට පෙනවපු තැනක් කොතන ද තියෙන්නේ?

Once you have seen the actuality for what it is, the assurances are fulfilled. This is what needs to be realized. The drawing in of Dhamma not air. This much has been clearly laid out in the discourses, where does it refer to the air.

(ශ්‍රාවක මහතෙක්): ස්වාමීන් වහන්ස, දැන් .... මහා කල්පයක් වැඩ හිටියේ නැත්තේ ආනන්ද ස්වාමීන් වහන්සේ වරයක් ඉල්ලුවේ නැති නිසා නේ, එතකොට ඒක ඕකට පටහැනි වෙනවා නේද?

A listener: Venerable Sir, isn't it because Venerable Ananda didn't ask the Lord Buddha to be for the entirety of a Maha Kalpa (an eon), the Lord Buddha's death occurred? Is this inconsistent with what you've been saying?

(ස්වාමීන් වහන්සේ): ඒ කිවුවේ? නෑ! ඒ තියෙන්නේ මෙහෙමයි, **"කපක් හෝ ආසන්න කාලයක් වැඩ ඉන්න පුලුවන්!"** සදහට වැඩ ඉන්න බෑ නේ!

Waharaka Thero: No it's not like that, a Buddha could've prolonged his life to a full eon (Ayu-Kalpa/ life span), can't live forever, can he?

දැන් උදයංගම – අත්ථංගම – ආස්වාද – ආදීනව – නිස්සරණ, නිස්සරණය වෙන්න ඉස්සෙල්ලා ආදීනව කාලේ නේ ඔය යන්නේ.

In the process of arising, continuance (growth), optimum, decaying and passing away, then the Lord Buddha was in the stage of decay.

දැන් උන්වහන්සේ හොඳට පැහැදිලි ව පෙන්නුවා නේ, එක අවස්ථාවක අවුව තපිමින් ඉන්නවා, සීතල වෙලාවේ. වයසට ගිහිල්ලා – අවුරුදු 80ක් වයස.

The Lord Buddha, clearly mentions this. Feeling cold, the Blessed one was warming in the sun, 80 years old.

ඒ වෙලාවේදී සිවුරු පොට අහක් කරලා ඉන්නකොට, ආනන්ද හාමුදුරුවෝ කියනවා. "අනේ ස්වාමීනි, කොහොම තිබිච්චි ශරීරයක් ද? දැන් මේ කොඳු ඇට ටික මතු වෙලා ඇට සැකිල්ල පේනවා. ඉළ ඇට පේනවා. ඇඟ ඔක්කෝම හම රැලි වැටිලා, මෙච්චර ලස්සනට තිබිච්චි හම. දැන් මේ පේන්නේ කොහොමද?"

Seeing the state of the Lord Buddha's physique, Venerable Ananda said, "It's amazing, Lord. It's astounding, how the Blessed One's complexion is no longer so clear and bright; his limbs are flabby and wrinkled; his back, bent forward; there's a discernible change."

"ඉතින් ආනන්ද, එහෙම තමයි දරන ලෝක ස්වභාවය මේකයි! හරියට ම ඔය දැන් පූනු ගෙවිච්ච, දිරච්ච බර කරත්තයක්, නාකි ගොනෙක් ඇදගෙන යන්නේ කොහොමද, එහාට වැනෙනවා – මෙහාට වැනෙනවා. ඒ වගේ තමයි දැන් මේ කයත්, බලන්නකෝ ලෝක ධර්මතාවයේ හැටි!"

"That's the way it is, Ananda. Even as an old cart, Ananda, is held together with much difficulty, so the body of the Blessed one is kept going only with supports. It is the norm, the actuality"

**ඉතින් බුදුරජාණන් වහන්සේ පෙන්වලා තියෙනවා නේ පැහැදිලිව ම මේ කයට වෙන එක! බුද්ධ දේහයටත් ඒක නේ වුනේ! උදයංගම වුනා – අත්ථංගම වුනා – ආස්වාද – ආදීනව – නිස්සරණ! ඒකටත් එච්චරයි!**

Lord Buddha has clearly pointed out what will happen to our physique, and even the physique of the Blessed one was no exception. Simply the manifestation of the arising, continuance, optimum, decaying and passing away.

කාලය ටිකක් ඉක්ම කරගන්න පුලුවන්, මොකද්ද මෙතන අර තියෙනවා සතර සෘද්ධි පාද වැඩූ අභිඥා ලාභියෙකුට පුලුවන් කමක් තියෙනවා ඕනේනම් ආයු සංස්කාරය කරලා පොඩ්ඩක් කාලයක් දික් කරගන්න. ඒ දික් කළා කියලා, සදහට තියා ගන්න බෑ නේ !

Could have prolonged his life to a full eon, due to his practice of the four bases to success. Could have prolonged, but not forever.

**"කල්පයක්" කියන්නේ ආයුෂ කල්පයක් – අවුරුදු 120ක්.** ඒ කාලය – ඒ කාලය, ඔවු, එච්චරයි! **"කල්ප" කියන්නේ කාල ප්‍රදේශය කියන එකයි. යමකට උරුම කාල සීමාව, කල්පය කියන්නේ.** ලෝකෙට – ලෝකෙට නම් ලෝක කල්ප.

Kalpa/ eon here means, Ayu-Kalpa/ life span. Kalpa means the time span. If it's for the earth, it would be a Maha Kalpa.

(ශ්‍රාවක මහතෙක්): අවුරුදු 80,000ක් වැඩ ඉන්න කාලෙක නම් ආයු කල්පය අවුරුදු 80,000ක්,

A listener: In times, where the Lord Buddhas were staying up to 80,000 years of age, the life span would have been 80,000.

(ස්වාමීන් වහන්සේ): ඔවු, අන්න ඒකයි. ජීවිත ආයුෂ නම්, ජීවිත ආයුෂ කල්ප. කාල ප්‍රදේශය කියන එකයි කල්ප කියන්නේ.

Waharaka Thero: Yes, if it is life, a life span (Ayu-Kalpa). Kalpa of something means the time span of its existence.

(ශ්‍රාවක මහතෙක්): එතකොට දැන් අර අවුරුදු 600 – 2,000 වගේ ජීවත් වෙන හින්දා මේ … (පැහැදිලි නැත) ….

A listener: Then because living between 600 – 2,000… <illegible>

(ස්වාමීන් වහන්සේ): ඔව්, ඉතින් ඒක හරි! මෙහෙම දෙයක් තියෙනවා. දැන් අපි නොදන්න පැති හුඟාක් තියෙනවා මේවායේ. දැන් **මේ මිනිස් කය තියාගෙන ඉන්න පුද්ගලයාට පුලුවක් කමක් තියෙනවා මනෝමය කයක් මවලා අහකට යන්න. ඒක එක අභිඥා ලාභී පුද්ගලයා අභිඥා ලබලා කරන වැඩක්.**

Waharaka Thero: Yes, that is true. There are many aspects to things that we don't know of. The person with the physical body, can create a metaphysical body and get out of the physical body. That is something only a person with supernatural knowledge (Abhijñā) can do.

ඒ මනෝමය කායිකත්වයෙන් ජීවත් වෙන පුද්ගලයාට පුලුවන් මේ කය පැත්තක තියලා මනෝමය කය ප්‍රගුණ කරගන්න. ඒකෙන් කාලා – බීලා, ඒ කය ජීවත් කරවලා, ඒක ඝනීභවන කරන්න පුලුවන්.

That metaphysical body could be mastered, without the need of a physical body. Live with it, eating and drinking with it, even solidifying it when required.

ඒ ඝනීභවනය කරගත්ත කෙනා, එයා දකිනවා, “මේ මස් – ලේ සහිතව හටගත්ත, මවු ගේ ශරීරයෙන් හටගත්ත, දෙතිස් කුණප කොට්ඨාසයෙන් යුක්ත මේ කුණු කය, වා – පිත් – සෙම් සහිත මේ කුණු කය තියාගන්න එකෙන් වෙහෙසට පත් වෙනවා, මං මේක දිරලා යන්න ඇරලා, මං මේකේ (මනෝමය කයේ) ඉන්නවා” කියනවා.

That person sees that the physical body of flesh and blood consists of thirty-two varieties of impurities (dethis kunapa) and is exhausting. Thus leaving it aside he hangs on to the metaphysical body.

ඊට පස්සේ මොකද කරන්නේ? අර ඒ අයගේ තමයි අර මේ වැල් ගිහිල්ලා, අත් අස්සෙන් වැල් ගිහිල්ලා එහෙම ගිහිල්ලා, අර ඇට සැකිලි තිබිච්චා වාගේ මෙහෙම ගිහිල්ලා, දිරා – දිරකඩ වෙලා යනවා කියන්නේ, ඔය යෝගීන් ගේ!

Then all creepers would grow all over that physical body, though the hands and all. The physical body remains still like a skeleton, going into decay. This happens to Yogis in particular.

**ඒ ශරීරය ඒ – මස් – ලේ ශරීරය. ඒක දිරකඩ වෙනකන්, මනෝමය කයෙන් එයා ජීවත් වෙනවා, පැත්තකට වෙලා.**

The physical body of flesh and blood goes in to decay, while he lives in the metaphysical body.

ඉතින්, ටික කාලයක් ගියාට පස්සේ මනෝමය කය ප්‍රගුණ කරගෙන, එයා ඉන්නේ අම්මා – තාත්තා ගෙන් ගත්ත කයේ නෙමෙයි ඒක. ඒ කයට, ඒ ජීවිත කාලයට යම් තරමක් උරුම ද, ඒ කාලය ඉන්න පුලුවන් – ඒක නිර්මාණය කරගත්ත කයට.

The metaphysical body can be mastered, and he will live in that throughout its life span.

හැබැයි, **ඒ කයත් උදයංගම වෙලා තියෙනවා – අත්ථංගම – දැන් ආස්වාද කාලේ යනවා. ඕකත් ආදීනවයට පත් වෙලා නිස්සරණයට පත් වෙන දවසක් තියෙනවා කවදා හරි!** ඒකයි කාරණය.

But even the metaphysical body has its expiry day as that too is subject to arising, continuance (growth), optimum, decaying and passing away.

(ශ්‍රාවක මහතෙක්): ඉතින් දැන් ඔය අවුරුදු 600 ක විතර හාමුදුරුවනේ ඉන්නවා කියන්නේ, ඒවගේත් ඉන්න පුලුවන් ද? එහෙම වෙන්න පුලුවන් නේ ඉතින්, ඒ ඉන්නේ අර කයෙන්. මේ මස් – ලේ කයෙන්, මේ අපි හිතාගෙන් ඉන්න මස් – ලේ කයෙන් නෙමෙයි.

A listener: They say that there are monks living up to 600 years even it’s quite possible nah? But that may be using that metaphysical body, not the physical body of flesh and blood, like we presumed.

දැන් අර – දැන් බලන්න ඒක, අපේ ඉන්න, අපේ මහ රහතන් වහන්සේලා අතරත් තිබුණා, අභිඥා ලාභීන් වහන්සේලාට – දැන් අර **"දබ්බ මල්ල පුත්ත"** හාමුදුරුවෝ කියන්නේ,

There were so many of such people among the Arahants of those days, having supernatural knowledge (Abhijñā) such as Venerable Dabba Malla Putta.

දැන් මේවා හදන්න දෙනකොට, වටේ මොකද අර ආසන පනවන්න – සිය ගාණක් ඇවිදිල්ලා එක පාර කියනවා "අපිට විනාඩි පහෙන් ආසන පනවලා දෙන්න" මේ මෙයාගේ මේක බලන්න හදන්නේ – අභිඥා බලය බලන්න! "හොඳයි!" කියනවා, යනවා, ගිහිල්ලා 100ක් විතර මවා ගන්නවා. මවාගෙන, කට්ටිය එක්කලා ගියා, ආසන ටික තිබ්බා, හදලා තිබ්බා, ඉවරයි! "ආ හරි!" කියනවා. අන්න එහෙම ශක්තියක් තියෙනවා.

He could arrange seats for even hundreds of monks within five minutes. He created multiple bodies of himself and all of them could function separately, doing the task at hand in no time. They had such extraordinary capabilities.

ඒක තමයි **මනෝ කය – මනෝමය කාය! අන්න ඒක මවන්න පුලුවන්. ඒක තමයි මනෝමය ඍද්ධි – ඍද්ධි විධ කියන්නේ.**

Those were metaphysical bodies, having metaphysical abilities.

ඒ ශක්ති තියෙන අයට ඒ කය මැවියහැකි, දහසක් – දැන් **චුල්ල පන්තක හාමුදුරුවෝ** දාහක් මවාගෙන හිටියා. ඇවිදින් බලපුහාම කාටවත් හොයන්න බෑ, එයා වාගෙමයි, තව අනිත් හාමුදුරුවොත් එයා වාගෙමයි. කතා – බහත් කරනවා ඒ වගේ, වැඩ-පල ත් කරනවා.

Those with supernatural knowledge could create any number of metaphysical bodies. Venerable Chulla Panthaka created thousand metaphysical bodies. All functioning independently, talking independently.

ඉතින් ඒවාගේ, ඉතින් **උන්වහන්සේලාට ඕනෑ** කමක් නෑ මේ ලෝකේ හරයක් නෑ කියලා දැකලා ඉවර හින්දා, ඕක මවාගෙන මෙහෙ ඉන්න ඕනෑ කමක් උන්වහන්සේලාට නෑ.

But since they have fully annihilated ignorance and have fully seen the fruitless nature of the worldly things, they do not wish to be even in those metaphysical bodies.

**ඉතින්, අවිද්‍යාව – තෘෂ්ණාව තියෙන නිසා ම ඔය ජාතියේ එකක් හදාගෙන අවුරුදු ගණන් ජීවත් වෙනවා මේ යෝගීන්!**

The Yogis however, lives long lives in such metaphysical bodies that they have created for themselves.

**ඒකයි හේතුව ඉතින්, යෝගීන් ඒකේ ජීවත් වෙන්නේ අනිච්ච – දුක්ඛ – අනත්ථ දන්නේ නැති හින්දා.**

Since they have no idea what Anicca, Dukkha, Anatta is, they don't see that their efforts would in fact go in vain.

ඒකයි, ඉතින් ඕක බුදුරජාණන් වහන්සේ ට බැරුව තිබුණාද? නෑ! එහෙම එකක් නෙමෙයි තිබුණේ, බුදුරජාණන් වහන්සේට පැවැත්මේ ඕනෑකම තිබුණේ

Couldn't the Blessed one have done even greater things. He simply could have, but he obviously knew better and had different ideas.

**"මාගේ භික්ෂු – භික්ෂුණී – උපාසක – උපාසිකා කියන සිවු වනක් පිරිස අධර්මයක් දුටු තැන ධර්මයෙන් කරුණු පෙන්වා අධර්මය යටපත් කර, ධර්මය නඟා සිටුවන්න දක්ෂ වෙනතුරු, අවිනයක් දුටු තැන විනයෙන් කරුණු පෙන්වා අවිනය යටපත් කොට විනය නඟාසිටුවන්න දක්ෂ වෙන තුරු මාරය, මගේ පිරිනිවන් පෑම බලාපොරොත්තු වෙන්න එපා!"** කියලා මාරයාට ඉස්සෙල්ලා බුදුරජාණන් වහන්සේ කිවුවා.

The Buddha had declared to Mara, "I would not die until, the four kinds of disciples (Bhikkus, Bhikkunis, laymen and laywomen) have come to be true disciples of the Blessed One — wise, well disciplined, apt and learned, are able to expound it, preach it, proclaim it, establish it, reveal it, explain it in detail, make it clear; and when adverse opinions arise, are able to refute them thoroughly and well, and to preach this convincing and liberating Dhamma".

ඒ ටිකටයි මගේ මේ බුද්ධ පැවැත්ම අවශ්‍යය වෙන්නේ, ඊට පස්සේ මට අවශ්‍යය නෑ ඉන්න. මේ මගේ ආසාවට, මගේ ඕනෑකමට මේ පැවැත්මේ ඉන්නවා නෙමෙයි.

"This is the purpose of living for a Buddha, beyond that there is no need for me to live. I have no desire to and I am not living because I want to"

අන්න ඒ කතාව කිවුවාට පස්සේ, 45 අවුරුද්දක් ගියාට පස්සේ තමයි අර ආනන්ද හාමුදුරුවොන් ඉන්න වෙලාවෙදි, අහක් වෙන වෙලාවෙදීම ඇවිදින් කිවුවේ,

Forty-five years after uttering those word, Mara came to the Lord Buddha, when Venerable Ananda was also present.

"ස්වාමීනි, ඔබවහන්සේ එදා බුදු වුන අවස්ථාවේදී මට පොරොන්දුවක් වුනා, ඒ කාලේ, මං පිරිනිවන් පාන්න ඉල්ලා හිටිනකොට. මාරය! මාගේ භික්ෂු – භික්ෂුණී, උපාසක – උපාසිකා කියන සිවුවනක් පිරිස අධර්මයක් දුටු තැන අධර්මය යටපත් කර, ධර්මය නඟා සිටුවන්න දක්ෂ වෙනතුරු, අවිනයක් දුටු තැන විනය නඟාසිටුවා අවිනය යටපත් කොට විනය නඟන්න දක්ෂ වෙන තුරු මාගේ පිරිනිවන් පෑම බලාපොරොත්තු වෙන්න එපා කිවුවා, අද ඒ ටික සිද්ද වෙලා ඉවරයි! ඒ පාර, ස්වාමීනි පිරිනිවන් පාන්න."

"Now, O Lord, the four kinds of disciples (Bhikkus, Bhikkunis, laymen and laywomen) have come to be true disciples of the Blessed One — wise, well disciplined, apt and learned, preservers of the Dhamma, are able to expound it, preach it, proclaim it, establish it, reveal it, explain it in detail, make it clear; and when adverse opinions arise, are able to refute them thoroughly and well, and to preach this convincing and liberating Dhamma. And now, O Lord, such has already been achieved. Therefore, O Lord, let the Blessed One come to his final passing away! Let the Happy One utterly pass away! The time has come for the Parinibbana of the Lord."

"මාරය! ඔය කිවුව කාරණය සිද්ද වෙලා තියෙනවා එහෙම්මම, ඒක ඇත්ත. මගේ දැන් ඉතින් බලාපොරොත්තු වෙන්න දෙයක් නෑ, තව තුන් මසකින් මං පිරිනිවන් පානවා, උඹ කලබල වෙන්න ඕනේ නෑ" කියලා අවස්ථාව දුන්නා.

"Mara, the Blessed One has become successful. Do not trouble yourself. Before long the Parinibbana of the Tathagata will come about. Three months hence the Tathagata will utterly pass away."

දැන් මෙතන හොඳට පැහැදිලිව පේන දෙයක් තමයි, එහෙනම් බුදුවරයන් වහන්සේ නමක් ලෝකේ පහල වෙලා වැඩ ඉන්නේ අර අවිද්‍යා – තෘෂ්ණාවෙන් නෙමෙයි. අනික් අයට වාගේ ජීවත් වෙන්න ආසාවට නෙමෙයි. අවශ්‍යය කාරණය කරන්න!

Now here it clearly shows, that a Buddha is born and lives in this world, not because of the ignorance and desire to live. The Blessed one has a mission to accomplish. He will live until the point it's achieved.

හැබැයි, **ඒ කාලේ වෙනකන් උන්වහන්සේලා මරන්නත් බෑ, කවදාවත්. එහෙනම්, බුදුන් මරන්න බෑ!** බුදුන් ගේ ලේ සොලවනවා කියනවා, ලේ උපද්දවනවා මිසක් – අන්තිම, එයින් එහාට බුදුන්ට කරදරයක් කරන්න බෑ!

But until such time comes, nobody can kill a Buddha. The most one can do is to draw blood. Beyond that no harm can be done to a Buddha.

මොකද, ඒක පාරමිතා පුරපු, අසංඛ්‍ය කල්ප ලක්ෂ ගණන් පාරමිතා පිරුවේ ඕකටයි. ඉතින් ඒකාලේ, මේ ලෝකේ සමතෙක් නෑ ඒ කාලේ අතරමඟ කඩාකප්පල් කරන්න. ඒ නිසයි බුදුරජාණන් වහන්සේව ඒ වගේ විනාස කරන්න බැරි. ඒක පාරමිතා බලයක්!

As a Bodhisattwa, our Lord Buddha has fulfilled perfections through four asamkhya kalpas (incalculable ages) and a hundred kalpas. Owing to the sheer power of the perfections fulfilled, a Buddha cannot be killed.

මේ මෙතන මේ උදයංගම – අත්ථංගම – ආස්වාද – ආදීනව – නිස්සරණ කියන එකට කිසි ප්‍රශ්නයක් නෑ! කොච්චර නඟා සිටෙවුවත් ඒකට හිමි කාලය යන්නේ ඔහොමයි.

This is not in contravention of the process of arising, continuance (growth), optimum, decaying and passing away. Whatever formed, will go through this process throughout its rightful life time.

උදයංගමය නැඟී හිටියා, ඉතින් එතකොට, ඊලඟට අත්ථංගමය වැඩිලා ආවා, ඒ ආස්වාද කාලය ඉතින් ඒකෙන් කරන්නාවූ වැඩපිළිවෙලක කරගෙන ගියා. බැරි කාලෙටත් ආවා, ආදීනව කාලෙටත් ආවා, නිස්සරණ වෙලා ඒකත් කෙළවර වුනා.

Arises, then grows, in the optimum stage the intended function is carried out, in the stage of decay, things will become much harder and then it duly passes away eventually.

**ලොවුතුරා බුද්ධ රාජ්‍යය පහල කළත්, සිද්ද වෙන්නේ ඕක! උදා වුනා – උදයංගමය, අත්ථංගමය – පැවැත්මට ආවා,**

With regard to the Gothama Buddha's dispensation even, the same thing actualizes. It arose, it continued to grow.

**ආස්වාදය – ඒකෙන් ඉතින් ලොකුවට අනිත් ඔක්කෝම මිත්‍යා දෘෂ්ඨී බිඳ හැරිලා, සම්මා දිට්ඨිය නැඟිලා ඇවිල්ලා විශාල ජයග්‍රාහී තත්ත්වයක් උදා වුනා – ආස්වාද,**

In its optimum time, at the peak of its glory, the wrong views were shattered and the right views were established, doing the sentient beings invaluable service.

**දැන් ඉතින් පිරිහිලා යන කාලේ ආවා, ආදීනව කාලේ – එකින් එක අඩුවෙලා අඩුවෙලා ගිහිල්ලා, නිස්සරණ – දැන් ඉතින් 5,000ක් යනකොට ඉවරයි!** පිරිහිලා යනවා. සරන්න බෑ දැන්, ආයි සාසනය යටපත් වුනා. ඉතින් ඒකත් එච්චරයි!

Then it came to the stage of decay, gradually going in to decline, and presumably at the end of 5,000 years it would pass away. A Buddha's dispensation will be no more.

ලෝකේ හැම දෙයක් ම ඔය ක්‍රියාවලියට යටත්. ඉතින්, අපි දකින්න ඕනේ ඕක දකිනවා නම්, එහෙනම් මේ උදයංගම – අත්ථංගම – ආස්වාද – ආදීනව – නිස්සරණ කියන මේ ධර්ම රටාව තුළ,

Each and every worldly thing, is subject to the actualization of arising, continuance (growth), optimum, decaying and passing away.

මේක නම් ධර්මතාවය, මේ තුළ නම් ගමන් කරන්නේ මේ හටගත්ත හැම දෙයක් ම, **හටගත්ත එකක වැජඹෙන්න මට කාලයක් නෑ! ඒක මුලාවක්!**

If this is the norm, how can we rely on any thing that came in to being. Doesn't matter how it seems, nothing is glorified. It is one big delusion.

එහෙනම්, හටගත්ත එකේදී මට ගන්න තියෙන්නේ ප්‍රයෝජනයක් ඕකෙන්, **අත්ථංගමය ආදීනවයට – නිස්සරණයට යන්න ඉස්සෙල්ලා හැකි තරම් ඉක්මන් කරලා අප්‍රමාදයෙන් යුතුව ආර්ය මාර්ගය පූර්ණය කරගන්න ඕනේ කියලා අන්න උත්සාහාවන්ත වෙනවා. වෙලා තමන්ගේ වැඩේ කරගන්නවා. අන්න ඒකයි එතන ගන්න නිගමනය!**

The only thing good about, these worldly things is, that we can understand them, their true nature, them being subject to arising, continuance (growth), optimum, decaying and passing away. We should be determined, to accomplish the Noble Path before this being that we are in now, passes away. Only that could be the possibly meaningful purpose for our otherwise petty lives. That is the conclusion we have to reach to.

එහෙනම්, එයාටත් හිත අලවන්න දෙයක් නැති බව එයා එතනම දන්නවා. "මං මොනවාට හිත අලවා ගන්නද? මොනවා අල්ලා ගන්නද? කොහෙද අල්ලාගන්න එකක් තියෙන්නේ? මං කිවුවාට පවතින්නේ කෝකද? එහෙම එකක් ලෝකේ නෑ!"

Then one comes to realise that there is nothing worthy to hold on to. What to hold on, where can anything be that is worthy of holding on to. There's no such thing in the world.

අන්න ධර්මතාවය දකිනවා. එතැන පටන්ගෙන එයා මොකද කරන්නේ? "ධර්මතාවයට අනුකූලව යන ලෝකය මට ඕනේ හැටියට හදන්න බෑ!

One sees the norm, the actuality. From there onwards, he come to realise that he can't keep anything to his liking, as the status of all things are governed by respective law and order of things, the convention.

එහෙනම්, **මෙච්චර කල් දැඟලුවේ, අනන්ත – අප්‍රමාණ සංසාරේ මං දැඟලුවා නම් දඟලලා තියෙන්නේත් ඕකට!**

Then why did we struggle for, to achieve what. Had we struggled in this infinite samasaric journey, what have we achieved thus far.

**දැන් මේ දඟලනවා නම් දඟලන්නේත් ඕකට, බැරි එකක් කොරන්න දැඟලීම අත් හැරලා අද ඉදන් යථාවබෝධයෙන් කටයුතු කරනවා!" කියලා,**

If we are struggling even now, that is also to do the impossible only. A mission impossible. The struggle will be put to a rest and the future actions will be based on factual comprehension of things.

**"වෙන එකක් වෙච්චාවේ, වෙන්න ඉස්සෙල්ලා ගත යුතු යථාවබෝධය ලබා ගන්න මං මේ ටික කරගන්නවා!"** කියලා, ධර්මාවබෝධය ලබා ගන්නවා. මොනවාට වත් කම්පා වෙන්නේ නෑ! ඒකයි අන්තිම නිගමනය.

"Let things be and will not fight what will be. I am doing what need to be done, to obtain the factual comprehension of things". Accordingly, achieves the understanding of Dhamma, leaving out all sorts of worries aside. That is the final conclusion.

~ අතිපූජ්‍ය වහරක අභයරතනාලංකාර හිමිපාණන් වහන්සේ ~

~ Late Ven. Waharaka Abhyarathanālankāra Thero ~